# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක් | www.budusarana.lk | Email:budusarana@lakehouse.lk

ශ්‍රී බුද්ධ වර්ෂ 2566 ක් වූ ඇසළ අමාවක පෝදා 2022 ජූලි 28 බ්‍රහස්පතින්දා BUDUSARANA THURSDAY JULY 28, 2022

ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. 57 කාණ්ඩය, 07පත්‍රය , පිටු 10 ආරම්භය 1965 - 06 - 13




සේරිවාණිජ ජාතක කතාව ඇසුරිනි



# තමන් නොදැවී අනුන්ට ද සිසිලක් වන හැටි

**අප කැමැති දේ සේ ම අකැමැති දේ ද වටපිටාවේ සිදුවේ. විටෙක කෙනකුගේ වචන සේ ම ක්‍රියාවන් ද අපගේ සිත දවන්නට තරම් බලවත් ය. එපමණක් නොවේ අපගේ සිතිවිලි, වචන හැසිරීම් නිසා අනුන් ද එසේ දැවෙන්නට පුළුවන. තැවෙන්නට පුළුවන.**

එහෙත් අප නිසා අනුන් නොදැවිය යුතු සේ ම අනුන් නිසා අප ද නොතැවිය යුතු ය. නොදැවිය යුතු ය. පළමුව තමන් තමන්ට මෙත් වඩන්න. අනුන්ට ද මෙත් වඩන්න. ඒ සඳහා පළමුව තමන් ඍජු ප්‍රතිපත්තියක පිහිටිය යුතු ම ය. තමන්, තමන්ට අවංකව, අනුන්ට ද අවංක විය යුතු ය. මැනවින් අවංක විය යුතු ය. එවිට තමන්ගේ සිතිවිලි නිවෙනු ඇත. වචන ද, හැසිරීම් ද නිවෙනු ඇත. ඒ අනුව තමන් නිසා අනුන් ද නොතැවෙනු ඇත.

තරහවෙන්, ක්‍රෝධයෙන්, වෛරයෙන් පිරුණු සිතක් මෙත් සිසිලෙන් නිවා සනසන්නට මෛත්‍රී භාවනාව මාහැඟි ඔසුවකි. මෙත් වඩන්නකු කෙරෙහි පුරුදු පුහුණු කළ යුතු ගුණ සමුදායකි. කරණීය මෙත්ත සූත්‍රයේ ඉගැන්වෙන ‘උජු ච සුජූච’ ආදී ගුණ ඉන් ප්‍රධාන ය. එනම් අවංක වීම ය. මැනවින් අවංක වීමය.

අවංක වූ පුද්ගලයා සාධාරණයට මිස අසාධාරණයට පක්ෂ නොවේ. ඇත්තට ගරු කරයි. සත්‍ය නොසඟවයි. බුද්ධියෙන් කරුණු දෙස බලනවා මිස කෙනෙක් කී දේ අසා තීරණ නොගනියි. ඇසෙන දේ ත්, දකින දේ ත් හමුවේ ඉක්මන් තීරණවලට එළඹෙන්නේ නැත. අසන දකින දේ වුව ද ඇතැම්විට වරදින්නට, වරදවා තේරුම් ගන්නට ඉඩ ඇති බැවිනි.

ඍජු ගුණ ඇති කෙනෙක් වේ නම්, ඔහු යමක් සිතුවේ ද එයම කියන්නේ ය. යමක් කීවේ ද එය ම කරන්නේ ය. ඇත්තට සමීප විය හැකි වන්නේ අවංක වූ තරමට ය. එහෙත් ඇතැම් උඩු යටිකුරු වූ සිතැඟි ඇත්තෝ සත්‍ය දේ උඩුයටිකුරු කරනු පෙනේ. කෙනෙක් නිවැරැදිකරුවන් වැරැදිකරුවන් කරති. වැරැදිකරුවන් නිවැරැදි අය කරති. වැරැදි වැඩ අනුමත කරති. හරි දේ යටපත් කරති. අවංක අයට ගරහති. වංක වූ අයම අගයති. සමාජයේ නොසතුට, අසහනය, පීඩනය වැඩි වන්නට මේ තත්ත්වය ප්‍රබල සාධකයකි.

තමන් උපමාවට ගනිමින් අනුන් ගැන ද සිතනවා නම් කිසිවෙක් ලෝකයට වංක වන්නේ නැත. හෙතෙම පළමුව තමන්ට අවංක වෙයි. දෙවනුව ලෝකයට ද අවංක වෙයි. එවැනි පුද්ගලයාගේ සිතිවිලි පිරිසුදු ය. ක්‍රියාවන් ද පිරිසුදු ය. සමාජයට ද සහනශීලී ය.

මේ සමාජය විවිධ ය. විෂම ය. එහෙයින් ම බොහෝ රැවටීම්වලට හසුවිය හැකි ය. එම රැවටීම ම ජීවිතය කනගාටුදායක තත්ත්වයකට පත්කළ හැකි ය. එහෙයින් ජීවත්වීමේ දී අවංක පුද්ගලයාත්, වංක පුද්ගලයාත් හඳුනා ගැනීම වැදගත් ය.

සිඟාලෝවාද සූත්‍රයේ දී එසේ දුරුකළ යුතු එවැනි වංක මිතුරන් ගැන අපූර්ව විස්තරයක් කෙරේ. පළමුවැන්නා අඤ්ඤදත්ථුහර ය. ඔහු, යම් දෙයක් බලාපොරොත්තුවෙන්, එය අරමුණු කර ගනිමින් ඇසුරට සමීප වේ. ප්‍රති උපකාරයක් නැත. දෙවැන්නා වචීපරමය . ඔහුගෙන් ලැබෙන්නේ වචනය පමණ ය. ක්‍රියාවෙන් නිහඬ ය.

“මට පුළුවන්කමක් තිබුණා නම් කොහොම හරි උදව්වට එනවා. හදිසියේ ලෙඩ වුණා නේ තරහ වෙන්න නම් එපා.”

මේ හා සමාන වදන් ඔබගේ ජීවිතයේ මොන තරම් ඇසී තිබෙනවා දැයි සිතා බලන්න. තෙවැන්නා අනුප්පියභාණී ය. ඇති තැන ගුණ කීමත්, නැති තැන ගැරහීමත්, නින්දා ගෙනදීම මත් මෙවැන්නන්ගේ පුරුදු ය.

අපාය සහාය මිතුරෝ ද සිටිති. ඔවුහු නරකට අනුබල දෙති. මෙවැනි ගති ඇති අය වංචනිකයෝ ය. ප්‍රයෝගකාරී ස්වභාවය ඇත්තෝ ය. එවැනි අය ඇසුරු කරන්නේ නම්, ළඟා වන්නේ අයහපත ය. විනාශය ය. එහෙයින් එවැනි අය දුරින් දුරු කළ යුතු සේ ම තමන් වෙත එවැනි දුර්ගුණ වේ නම්, හිරු දුටු පිනි දියවී යන්නා සේ ඉන් මිදෙන්නට වෑයම් කළ යුතු ය.


තමන් තමන්ට, අනුන්ට අවංක වන්නා සේ ඇසුරට තෝරා ගත යුතු ද එවැනි කලණ මිතුරන් ය. එවිට ජීවිතය පහසු ය. එවැන්නෝ ඔබගේ ප්‍රශ්න, ගැටලුවල දී, දුකේ දී, අසහනයේ දී ළඟින් සිටිති. උදව් උපකාර කරති. සතුටේ දී අවංකව ම සතුටු වෙති. වරදින් මුදවති. යහපතෙහි යොදවති. රහස් සඟවති.

ඡන්දය, ද්වේෂය, භය හා මෝහය සතර අගතියයි. ඍජු ගුණ ඇති පුද්ගලයා සතර අගතියෙන් තොර ය. ඔහු, ඥාති හිතවතුන් වූ පමණින්, සම්බන්ධකම් තිබූ පමණින් ඒ කවරකු හෝ වෙනුවෙන් අසාධාරණ තීරණ නොගන්නේ ය. එමෙන්ම ඔවුන් කී පමණින් දෙයක් පිළිනොගන්නේ ය. තීරණවලට එළැඹෙන්නේ වැරැද්ද, නිවැරැද්ද දැකීමෙනි. ඍජු ගුණ ඇත්තා තරහ අයට ද, විරුද්ධ අයට ද අසාධාරණයක් නොකරයි. තනතුරට, ධනයට, බලයට, නිලයට, කුලයට, ලොකුකමට වෙනසක් නැත. ගුණවතුන්ගේ ගුණ අගයයි. ඕනෑම සභාවකට නොබියව මුහුණ දෙයි. මුලු ගැන්වෙන්නේ ද නැත. එහෙත් වංක පුද්ගලයා කතාවට බිය ය. ප්‍රශ්නවලට බිය ය. සභාවකට මුහුණ දෙන්නට මැළි ය.

අවංක චරිතයකට තවත් වටිනාකමක් එක් කරන්නේ ප්‍රතිපත්තිගරුක බවයි. ඒ පුද්ගලයා නින්දා ප්‍රශංසා හමුවේ ද, ලැබීම් නොලැබීම් හමුවේ ද ප්‍රතිපත්ති පාවා නොදෙන්නේ ය. එහෙත් එවැනි චරිත විරල ය.

**මුඛං පද්ම දලාකාරං**
**වාචා චන්දන සීතලං**
**මධු තිෂ්ඨති ජිව්හාග්‍රෝ**
**හෘදයෙතු හලා හලං**

මේ පැරැණි සංස්කෘත කාව්‍යයකි. එයින් කියැවෙන්නේ, සමහර අයගේ මුහුණ නෙලුම් මලක් වැනි ය. වදන් සඳුන් සේ සීතල ය.



බළංගොඩ ශ්‍රී ධර්මානන්ද පිරිවෙන් විහාරාධිපති
**කරගොඩ උයන්ගොඩ මෛත්‍රීමූර්ති මහ නා හිමි**

දිවග මී පැණි වැටෙන්නා සේ මිහිරි වචන ය. එහෙත් හදවත හලාහල විෂය යනුවෙනි.

මෙවැනි පුද්ගලයින් සිතේ යම් සිතිවිල්ලක් සිරකරගෙන අනෙකක් පෙන්වති. අනෙකක් ම කරති. ප්‍රතිපත්ති නොරකිති. එවැනි කෙනෙක් පවුලක ප්‍රධානියා වුව ද, ආයතනයක ප්‍රධානියා වුව ද ගැටලු ය. හරි වැරැද්ද නොසොයා වැරැදිම දකිති. අසල්වැසි නිවැසියන් හොඳින් නම් නැති අඩුපාඩු සොයති.

ඔබත් එවැනි ගති ඇති අයෙක් නම් මේ දුර්වලකම් මඟහරවා ගත යුතු ය. අනුන් ගැන සෙවීම නොව වැදගත් වන්නේ තමන් ගැන සෙවීම ය. අනුන් වෙනුවෙන් මෙත් වඩන්නට හැකි වන්නේ එවැනි ඍජු ගුණ ජීවිතයට පුරුදු පුහුණු කරන කෙනාට ය.

මඝ මානවක පන්සිල් සිය ජීවිතයට ප්‍රතිපත්තියක් ලෙස පුරුදු කළ තරුණයෙකි. කවර ප්‍රශ්නයක් හමුවේ වුව ද ඔහු ඍජු තීරණ ගත්තේ ය. කිසිදු විටෙක ප්‍රතිපත්ති පාවා නොදුන්නේ ය. රජු විසින් ඔහු ඇතකු ලවා පාගා මැරවීමට අණ කරනු ලැබූව ද ඇතා ඔහුට සමීප නොවූයේ ය. ඒ ප්‍රතිපත්තිගරුක බවේ අනුසස් ය.

# පරිත්‍යාගයෙන් හා අවබෝධයෙන් රැකිය යුතු සීලය

**සිල්වත් ගුණවත් බ්‍රාහ්මණ පඬිවරයෙක් සැවත් නුවර වාසය කළේ ය. තෙරුවන් සරණ ගිය මේ බ්‍රාහ්මණතුමා නොකඩවා පන්සිල් රකින, වේදත්‍රය ද උගත් අයෙකි. කෙසොල් රජු මොහුට ප්‍රිය කළේ ය. ගරු කළේ ය. හොඳම කල්‍යාණ මිත්‍රයකු ලෙස බ්‍රාහ්මණ තුමා ඇසුරු කළේ ය.**

මෙසේ කාලයක් ගෙවුණි. දිනක් බ්‍රාහ්මණතුමාට මෙවැනි සිතිවිල්ලක් පහළ විය. "මට රජතුමා මෙතරම් සලකන්නේ ඇයි? මාගේ ජාතිය නිසා ද? කුලය නිසා ද? උගත් නිසා ද? එසේත් නැතිනම් මගේ සිල්වත්කම හා ගුණ යහපත්කම නිසා ද? මේ ගැන හොයා බලන්න ඕනෑ කියල පරීක්ෂණයක් කළේ ය.

දිනක් මේ බ්‍රාහ්මණයා රජ ගෙදරට යන ගමනේ රාජ භාණ්ඩාගාරයට ගොස් එහි භාණ්ඩාගාරිකවරයා ඉදිරිපිට කහවනුවක් රැගෙන ගියේ ය. භාණ්ඩාගාර නිලධාරියා ඒ ගැන සිතුවේ මෙලෙස ය. "අපගේ රජු පමණක් නොවේ, අපි සියලුම දෙනා මේ බ්‍රාහ්මණතුමාට ගරු සැලකිලි" දක්වනවා. අපේ රජතුමාගේ හොඳම මිත්‍රයා තමයි මේ බ්‍රාහ්මණතුමා. ඒ නිසා මේ ගැන කිසිවක්, කිසිවකුටත් නොකියා නිශ්ශබ්දව ඉන්න ඕනෑ" කියලා හිතුවා.

මේ සිද්ධිය වූ දිනට පසු දින නැවත වරක් බ්‍රාහ්මණයා රාජ භාණ්ඩාගාරයට පැමිණ කහවනු දෙකක් රැගෙන ගියේ භාණ්ඩාගාර නිලධාරියා බලා සිටියදී ය. එදිනත් බමුණාගේ ගුණයහපත්කම ගැන සිහිකොට නිශ්ශබ්ද විය. කිසිවක් කිවේ ද නැත.

තුන්වැනි දිනයේ බමුණා පෙර පරිදිම භාණ්ඩාගාරයට පැමිණ කහවනු අහුරක් රැගෙන ගියේ ය. මේ මොහොතේ දී භාණ්ඩාගාර නිලධාරිවරයාගේ ඉවසීමේ සීමාව ඉක්ම ගියේ ය.

බොල බමුණෝ, නුඹ සිල්වත් ගුණවත් උගත් කෙනෙක් කියල රජතුමා ඇතුළු අපි හැමෝම හිතාගෙනයි හිටියේ. නුඹ වංචා කාරයෙක්, හොරෙක්, නුඹ දුශ්ශීලයෙක්, අද තමයි නුඹේ හැටි තේරුනේ".

කියමින් භාණ්ඩාගාරවරයා පහර කීපයක් බ්‍රාහ්මණයාට එල්ල කළේ ය . මේ ශබ්දයෙන් කලබල වූ අවට සිටි පිරිස් එම ස්ථානයට දිව ආහ. සිද්ධිය අසා දැනගත් ඔවුහු බමුණාට හොඳටම තැලූහ. අවසානයේ අත්පා බැඳ රජු වෙතට රැගෙන ගියේ ය.

රජු කරුණු විමසීය. සිද්ධිය පිළිබඳ රජු පුදුමයෙන් පුදුමයට පත්විය. ගුණයහපත් වූ, සිල්වත් වූ මාගේ උගත් මිත්‍රයා මෙහෙම දෙයක් කළේ ඇයි දැයි රජුට අදහාගත නොහැකි විය. රජු සිද්ධිය පිළිබඳ බමුණාගෙන් කරුණු විමසීය. "අනේ දේවයන් වහන්ස මම හොරෙක් නෙවෙයි. ඔබ තුමාත් අනෙකුත් අයත් මට සලකන්නේ මගේ ජාතිය, කුලය, ගෝත්‍රයට ද? නැතිනම් උගත්කමට ද? එසේත් නැතිනම් මගේ සිල්වත්කම, සංවරකම, ගුණ යහපත් කම් ආදිය සලකලා ද කියල මට හොයා බලන්න හිතුණා.

දැන් මම දැන ගත්තා මේ හැමෝම මට සැලැකුවේ, ගරු කළේ" මගේ සිල්වත්කමටත්, ගුණයහපත්කමටත් බව. ඒ සිල්වත්කම නැතිවුණාම සලකන හැටි මට දැන් අවබෝධ වුණා රජතුමනි.

මුළු ලෝකයම සලකන මේ උතුම් සීලය මම මැරෙන තෙක් ආරක්ෂා කරන්න ඕනෑ. ඒ නිසා රජතුමනි, මට මේ උතුම් සීලය ගිහිගෙයි ඉඳලා කවදාවත් නිවැරැදිව ආරක්ෂා කරන්න බැහැ. ඒ නිසා මේ දඬුවමින් මා නිදහස් කරන්න. මට මහණ වෙන්න අවසර දෙන්නයි, ඔහු ඉල්ලා සිටියේ ය.

සියල්ල තේරුම් ගත් කොසොල් රජතුමා ඔහු නිදහස් කළේ ය. බ්‍රාහ්මණ තුමා රජුගෙන් අවසරය ගෙන ජේතවනාරාමයට ගොස් පැවදිව උපසම්පන්න වී නොබෝ කලකින් මහරහත් භාවයට ද පත්විය.

ධම්ම පදයේ සහශ්‍ර වර්ගයේ එන පහත සඳහන් ගාථා රත්නයෙන් කියැවෙන්නේ සීලයේ අනුසස් ගැනයි.

යෝ ච වස්සසතං ජීවේ දුස්ශීලෝ අසමාහිතො"



දෙහිඅත්තකණ්ඩිය
කපුවත්ත ආරණ්‍ය සේනාසනයේ
ශාස්ත්‍රවේදී
**බිබිලේ ධම්මසිරි හිමි**

සිල්වත් නොවී අවුරුදු සියයක් ජීවත් වෙනවාට වඩා සිල්වත්ව එක දවසක් ජීවත්වීම උතුම් බව සඳහන් කරයි.

මෙය සනාථ කරන පුංචි කතාවක් ශ්‍රී ලංකාවේ රුහුණු රටින් වාර්තා වේ.

දිනක් රුහුණු ප්‍රදේශයේ පදිංචි ගොවි මහතකු වැල් සහ කෝටු කපා ගැනීම සඳහා වනයකට වැදුණේ ය. ඔහු පංච ශීල ප්‍රතිපදාවේ නියැළෙන සිල්වත් පුද්ගලයෙකි. හදිසියේ ම ඔහු නොදැනුවත්වම විශාල පිඹුරකු ඔහුව වෙළා ගත්තේ ය. ඔහුගේ අතේ තිබුණ පිහිය ගෙන පිඹුරාට පහර දීමට සූදානම් විය. එහෙත් ඔහුට සමාදන් වූ ශීලය සිහි විය. සිල්පද කැඩීමෙන් සිදුවන ආදීනව මතක් විය. එනිසා පිඹුරා ඝාතනය කිරීමේ අදහස ඔහු අත්හැරීය. නමුත් තම ජීවිතයට හානියක් සිදුවන බව ඔහුට දැනෙන්නට විය.

නැවත පිහිය ගෙන පිඹුරාට පහර දීමට උත්සාහ දැරීය. එහෙත් සියල්ල අභිබවා ඔහුගේ සිතට ශීලයේ ආනිශංස ගලා එන්නට විය. ඒ නිසා දෙවැනි වර ද ඔහු ඉවසීය. එහෙත් පිඹුරාගේ පීඩනය එන්න එන්නම වැඩි විය.


> **ඔහුගේ අතේ තිබුණ පිහිය ගෙන පිඹුරාට පහර දීමට සූදනම් විය. එහෙත් ඔහුට සමාදන් වූ ශීලය සිහි විය. සිල්පද කැඩීමෙන් සිදුවන ආදීනව මතක් විය. එනිසා පිඹුරා ඝාතනය කිරීමේ අදහස ඔහු අත්හැරීය.**

මරණ බිය ද ඇති විය. ඒ නිසා තුන්වැනි වතාවට ද පිහිය ගෙන පිඹුරා කපා කොටා මරා දැමීමට සූදානම් විය. එහෙත් ඔහුගේ සිහිය නැවත අවදි විය. මම උතුම් ශීලයක් රකින්නෙමි. මම දිවි හිමියෙන් ප්‍රාණඝාතය දැන දැන නොකරමි. ඔහු අධිෂ්ඨාන කළේ ය. පිහිය ළඟ තියෙන නිසා මැරීමේ සිතක් ඇති වෙන්නේ යැයි සිතූ ඔහු පිහිය ඈතට විසි කළේ ය.

අහෝ පුදුමයකි. උතුම් ශීලයක් දිවි හිමියෙන් ආරක්ෂා කරන ඔහුගේ සිරුර පිඹුරාට දැනුනේ ගිනියම් වූ යකඩ කඳක් වෙළා සිටිනවාක් මෙන් ය. පිඹුරාගේ දරන ලිහිල් වී ගොස් ගොවි මහතා නිදහස් විය.

ධර්මයේ පිහිටි පුද්ගලයා ධර්මය විසින් ආරක්ෂා කරන බව මෙම සිද්ධීන්වලින් අපට තහවුරුවේ.

කය, වචනය, සංවර කර ගන්නා සිල්වත් පුද්ගලයා ද, මරණයෙන් පසු සුගතියක ප්‍රතිසන්ධි ලබන බව ධර්මයේ සඳහන් වේ. සිල් ආරක්ෂා කරන පුද්ගලයාට එලොව මෙලොව වශයෙන් බොහෝ ආනිසංස ලැබෙන නිසා සීලය ජීවිත පරිත්‍යාගයෙන් හා අවබෝධයෙන් යුතුව සුරැකීම වටින්නේ ය.



බුදුසරණ
35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069

ඇසළ අමාවක 2022-07-28

## අස්වැන්න වපුරන තරමට ය

ගොවියා කෙතක් අස්වද්දන්නේ බොහෝ වෙහෙස මහන්සි වීමෙනි. ඒ සරු අස්වැන්නක් ලබනු සඳහා ය. එහිදී හොඳ බීජ වර්ගයක් තෝරා ගැනීම, බිම් සැකසීම ආදී මූලික අවස්ථාවේ සිට සෑම පියවරක් ම අනලස්ව, කාර්යශූරව, උත්සාහය උනන්දුව ඇතිව ක්‍රමානුකූල ව සපුරා ගත යුතු ය. තමන්ගේ බලාපොරොත්තු ඒ අයුරින් ම ඉටුවනුයේ එසේ කටයුතු කළේ නම් පමණි. ගැමි වහරින් කියනවා නම් අස්වනු ලැබෙන්නේ වැපිරූ තරමට ය.

මේ කියමන ගොවිතැනට පමණක් නොවේ, ජීවිතයට ද අදාළ ය. ජීවිතයේ දියුණුව සේ ම පරිහානිය ද හිමි වන්නේ අප කරන කියන ක්‍රියා කලාපයන්ගේ ගති ස්වභාවය අනුව ම ය. ළමා කාලය ගත කරන අවස්ථාවේ සිට වයෝවෘද්ධත්වයට පත්වන තුරුම, එසේ නැතිනම් උපතේ සිට මරණය දක්වා ම ඒ දහම පොදු ය.

ළමයා තම ජීවිතය නමැති කෙත අස්වද්දන්නේ ඉගෙනීම තුළිනි. ඉගෙනීම තුළින් උසස් සාමාර්ථ ලබන්නට නම් අනලස් විය යුතු ය. උනන්දුව, ඕනෑකම තිබිය යුතු ය. නිවැරැදි ඉගෙනුම් මාවතක් තෝරා ගත යුතු ය. ගුරුවර වැඩිහිටියන්ගේ බසට අවනතව තමන්ගේ වයසට ගැළපෙන ලෙස උත්සාහයෙන්, වීර්යයෙන් ඉගෙනීමේ කටයුතුවල නියැළෙන දරුවාට වරදින්නට ඉඩක් ඇත්තේ ම නැත.

හොඳ පුරවැසියකු විය හැකි වන්නේ ද, ඉහළ මට්ටමේ ජීවන වෘත්තියක් තෝරාගත හැකි වන්නේ ද හොඳ අධ්‍යාපනයක් ලැබුවේ නම් ය. ඒ සඳහා ළමයාට හොඳ මාර්ගෝපදේශකත්වයක් ලැබිය යුතු ම ය.

විශේෂයෙන් පාසල් අධ්‍යාපනය තුළ පොතපත කට පාඩම් කිරීම තුළ පමණක්, දැනුම ලබා ගැනීම තුළ පමණක් හොඳ පුරවැසියෙක් විය නොහැකි ය. ජීවිතයට ප්‍රායෝගිකව භාවිත කළ හැකි හොඳ පුරුදු, යහපත් ආකල්ප විෂයානුකූලව පෙළ පොත් තුළ අන්තර්ගත ය. සමාජය උඩුයටිකුරු වන්නේ එම යහපත් ගුණාංග ජීවිත තුළ පුරුදු පුහුණු වී නොමැති නිසා ය. වෙනත් ලෙසකින් කියනවා නම් නිසි පරිදි ළමයාගේ මනස නමැති කෙතේ, යහපත් ලෙස බීජ රෝපණය වී නොමැති නිසා ය.

සමාජයට ආකල්පමය වෙනසක් අත්‍යවශ්‍ය ම කාලයක් උදා වී ඇති බවට මෙකල බොහෝ උදාහරණ ඇත. ඉවසීම, අනුන්ගේ දුකෙහි දී සංවේදී වීම, උදව්වක් උපකාරයක් ඇවැසි මොහොතක පිහිට වීම, ගරු කිරීම ආදී යහපත් චර්යාවන්ගේ සමාජය දිළිඳු වී ඇති දැයි සිතෙන තරමට ඇතැම් සංසිද්ධීන් උදාහරණ ගෙන එයි.

දින කිහිපයකට පෙර දුම්රියක් තුළ සිදුවූ එක් සිදුවීමක් දෙස පමණක් අවධානය යොමු කරමු. දුම්රිය තුළ බීමතින් හැසිරුණු තරුණයන් දෙදෙනකුගේ ක්‍රියා කලාපයේ අවසානය වූයේ එහි රාජකාරියේ නියුතුව සිටි නිලධාරියකු පා පහරක් නිසා බිම ඇද වැටී මිය යෑම ය. කුරා කුහුඹුවකුටවත් වරදක් නොවන ලෙස ජීවත් වීමට තරම් යහ ආකල්පවලින් පොහොසත් විය යුතු වුවත් මිනිසෙක් මිනිසකුගේ ම ප්‍රාණය උදුරා ගන්නට සැහැසි වීම මොන තරම් ඛේදජනක ද? මොනතරම් සමාජ විපරිණාමයක් ද?

මේ තරුණයන්ට කුඩා කාලයේ තැනට සුදුසු ලෙස ජීවත්වන හැටි උගන්වා තිබුණේ නම්, ගෞරවණීයව ජීවත්වීම පිළිබඳ ආකල්පයන්ගෙන් පෝෂණය වී සිටියේ නම් දුම්රිය වැනි සිය ගණනක් පිරිස් පරිහරණය කරන පොදු ප්‍රවාහන සේවයක සිට බීමතින් හැසිරෙන්නේ නැත.

ඔවුන්ගේ අවසානය විසඳුණේ එක් මිනිසකුට ජීවිතය අහිමිවීමෙන් පමණක් නොවේ. තමන්ගේ ගරුත්වය කෙලෙසා ගැනීම, අහිංසක දූ දරුවන්ට පියෙක් අහිමිවීම, මව්පියන්ට දරුවෙක් අහිමි වීම ආදී ඛේදාන්ත රාශියක් ඉතිරි කරමිනි.

එහෙයින් ජීවිතය නැමැති කෙත යහපත් ආකල්පයන්ගෙන් ද අස්වැද්දීම පිළිබඳ අලුතෙන් සිතා බලන්නට, ඒ සඳහා නව ක්‍රමවේද ඇති කරන්නට කාලය එළඹ ඇත.

# වස්සානයේ පින් පුරමු



මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
රාජකීය පණ්ඩිත,
ශාස්ත්‍රපති
පූජ්‍ය
**කොටනෙළුවේ පුඤ්ඤානන්ද හිමි**

**දායකයන් විසින් වස් ආරාධනා කරනු ලැබුව ද, නොලැබුව ද භික්ෂූන් වහන්සේ වස් සමාදන් වීම සිදු කරති. දයකයෝ උන්වහන්සේට වස් ආරාධනා කොට තමන්ට පින් රැස් කර ගැනීමට මාර්ගයක් සකසා ගනිති.**

දායකයා විසින් වස් ආරාධනා කොට වස්තුන් මාසය තුළ හාමුදුරුවන්ට සිව්පසයෙන් සංග්‍රහ කිරීමට පොරොන්දු වූ පසු චීවරයක් පූජා කරන්නේ වස් අවසානයේ දී ය. කඨින සිවුර කියා පූජා කරන්නේ එම සිවුර යි. ඒ අනුව චීවර පූජාව සිදු කරනු ලබයි. එහෙත් අනෙකුත් පින්කම් මුල සිටම සිදු කරයි.

චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලාන ප්‍රත්‍ය යනු සිව්පසය යි. මෙහි පිණ්ඩපාත යනුවෙන් අදහස් කරන්නේ දානය යි. වස් වසා වැඩ සිටින භික්ෂූන් වහන්සේට දායකයන් විසින් වස් කාලය තුළ දානය ගෙනැවිත් පූජා කළ යුතු ය. උන්වහන්සේට වස් කාලයේ පිණ්ඩපාතයේ වැඩම කිරීම කැප නැත. එනිසා දායකයින් මෙම කාලයේ අනිවාර්යයෙන් ම දානය ගෙනැවිත් පූජා කිරීම සිදුකළ යුතු ය.

සේනාසන පූජා කිරීම යනු හාමුදුරුවන් වහන්සේට වැඩ සිටීමට අවශ්‍ය ආවාසයක් පූජා කිරීම යි. බොහෝ විට සිදු වන්නේ විහාරස්ථානයේ වැඩ සිටින ලෙස ආරාධනා කිරීම යි. භික්ෂූන් වහන්සේ එම විහාරස්ථානයේ හෝ ආරණ්‍ය සේනාසනයේ ඇති කුටියක හෝ ආවාසයක වැඩ සිටිති. එහෙත් අපේ දායක පින්වතුන් වස් කාලය අවසානයේ කඨිනයට පෙර විහාරස්ථානය හුණු පිරියම් කිරීම හෝ තීන්ත ගෑම, කැඩුණු බිඳුණු තැන් පිළිසකර කිරීම වැනි දේ සිදුකොට ආවාස පූජාව වෙනුවට ආවාස නඩත්තුවට හෝ දායක වීම සිදු කරති.

ගිලන්පස යනු බෙහෙත්වලට නමකි. අද අපේ බෞද්ධයෝ ගිලන්පස යනුවෙන් හඳුන්වන්නේ තේ, කෝපි, සුප් හෝ හාමුදුරුවන් වහන්සේ වළඳන පලතුරු බීම වැනි දේ යි. එවැනි දේ ගිලන්පස ලෙස පූජා කිරීම ද වරදක් නැත.

එහෙත් ගිලාන යනු ලෙඩාට කියන නමකි. පස යනු ප්‍රත්‍යය යි. ලෙඩාට දෙන බෙහෙත් ගිලන්පස වේ. එමනිසා භික්ෂූන් වහන්සේට වස් කාලය තුළ අසනීප වුවහොත් බෙහෙත් ගෙනැවිත් දීම ආදිය සිදුකළ යුතු ය. එය ගිලන්පසවලින් සංග්‍රහ කිරීමකි.

ඒ අනුව දායකයා දිනපතාම නොව එම කාලය තුළ අවශ්‍ය වේලාව බලා තමන් සිවුපසයෙන් සංග්‍රහ කිරීම නියම පිළිවෙළයි. එසේ පින් රැස් කර ගන්නා අතරම දායකයා ද සිල්වත්ව එම කාලය ගත කළ යුතු ය.

මෙහිදී සිව්පසය පූජා කිරීම පිළිබඳ බොහෝ දායකයන් කැපවීමෙන් ක්‍රියා කරන බව පෙනේ. අඩුම තරමින් වස් කාලයේවත් හාමුදුරුවන්ට දානයක් පූජා කරන්නට ඕනෑ යනු බොහෝ දෙනකුගේ අදහසකි.ඒ වස්කාලයේ දානය පූජා කළාම වැඩියෙන් පින් සිදුවනවා කියන නිසයි.

ඒ කාරණය ඇත්ත ද? එහි සත්‍යයක් තිබේ. වස් කාලයේ දානය පූජා කළාම වැඩියෙන් පින් සිදුවීමට හේතුව එම කාලයේ හාමුදුරුවන් වහන්සේත් වඩාත් සිල්වත්ව ගත කරන කාලය යි. දායකයින් ද සිල්වත්ව ගත කරන කාලය යි. සිල්වතුන් විසින් සිල්වතුන්ට දෙන දානයෙහි අනුසස් වැඩි බව බුද්ධ දේශනාවයි. ඒ අනුව එම කියමනෙහි වරදක් නොපෙනේ.

උදේ පාන්දර විහාරස්ථානයට කැඳ රැගෙන ගොස් පූජා කිරීම, හීල හා දවල් දානය පූජා කිරීම, හවසට දැහැත්, ගිලන්පස හෝ පලතුරු බීමක්, සුප් එකක් වැනි දෙයක් පූජා කිරීම කළ හැකි ය. එය කළ යුත්තේ ද හාමුදුරුවන් වහන්සේගෙන් විමසා කැමැත්ත අනුව ය.

සමහර හිමිවරු හවස්වරුවේ සුප් ආදිය වළඳන්නේ නැත. එහෙත් අසනීප හාමුදුරුවන් වහන්සේ සමහරවිට වළඳනවා වන්නට පුළුවන. එනිසා විමසා බලා ක්‍රියා කිරීම වැදගත් වේ.



හාමුදුරුවන් වහන්සේට ඇප උපස්ථාන කොට පින් සිදුකර ගන්නවා මෙන් ම, තමන් ද භාවනා කරමින් හැකි තරම් නිවනට ළඟාවීමට උත්සාහ ගත යුතු ය. බුදුරජාණන් වහන්සේ ජීවමානව සිටි අවධියේ සමහර දායකයන් භික්ෂූන් වහන්සේ සමඟම භාවනා කොට රහත් වූ පුවත් අසන්නට ලැබේ.

අදත් සමහර ප්‍රදේශවල උපාසක උපාසිකාවන් භික්ෂූන් වහන්සේ වස් වසා සිටින මාස තුන තුළ ඔවුන් ද අටසිල් හෝ දස සිල් සමාදන් ව වාසය කරන අයුරු දක්නට ලැබේ. මෙසේ කිරීමට යමකුට හැකියාවක් වේ නම් එය මහත් භාග්‍යයකි.

නිවෙස්වල ඇති කරදර කම්කටොලුවලින් මිදී තම ජීවිත කාලයෙන් මාස තුනක් හෝ කැප කිරීමට ලැබීම මොන තරම් භාග්‍යයක් ද?

බුදුරජාණන් වහන්සේ වැඩ සිටින කාලයේ එක් උපාසිකාවක් ද හාමුදුරුවන් වහන්සේගෙන් භාවනාව ඉගෙනගෙන භාවනා කරන්නට පටන් ගත්තා ය. ඇය හාමුදුරුවන්ටත් ප්‍රථමයෙන් අනාගාමී වූවා ය. ඇය හාමුදුරුවන් වහන්සේට අවශ්‍ය කරන දානාදියත්, හාමුදුරුවන් වහන්සේ කැමැති දේත් ගෙනැවිත් දුන්නී ය. මෙහිදී භික්ෂූන් වහන්සේ තම සිතේ ඇති දේ මේ උපාසක අම්මා දකිනවා කියා බියට පත්වී එහි සිටීමට නො හැකි බව බුදුරජාණන් වහන්සේට දැන්වූහ. බුදුරජාණන් වහන්සේ එහි ම ගොස් භාවනා කරන ලෙසට දන්වා සිටියහ.

මෙම කතා පුවත දෙස බැලීමේ දී අපට පෙනී යන්නේ සමහර විට හාමුදුරුවන් වහන්සේටත් කලින් ගිහි ඇත්තන්ට වුව ද මාර්ගඵල ලැබිය හැකි බවයි. ඒ සඳහා උනන්දුවන අයට මෙය ඉතා හොඳ අවස්ථාවකි.

භික්ෂූන් වහන්සේ සමඟ මෙම මාස තුන සිල්වත් ව හා ගුණවත් ව ගෙවනවා යන අධිෂ්ඨානය ඇතිව යම් කෙනෙක් කටයුතු කරන්නේ නම් එය වස් කාලයේ පින් පුරවා ගැනීමකි.

# අන්ධ මව පෝෂණය කළ බෝසත් ඇත්රජුගේ කතාව

**එක්තරා කාලයක අප බෝසතාණන් වහන්සේ හිමාලයේ ඇත් කුලයක උපත ලැබුවා. මේ ඇත් රාජයා ශ්වේත වර්ණයි. ඉතා අලංකාර යි. ඇතුන් අසූදහසක් ඔහුට පිරිවර ලෙස සිටියා. මහා බලසම්පන්නව කාලය ගත කළා.**

මේ ඇත් රජුගේ මව අන්ධ යි. එනිසා ඇතා පලවැල ගෙනැවිත් වෙනත් ඇතුන් අත මව වෙත යවනවා. ඒ ඇත්තු මේ සියල්ල මවට නොදී ඔවුන් කා දැමීමට පුරුදුව සිටියා.

බෝසත් ඇතාට මේ බව දැනී හොර රහසේ ම පරික්ෂා කර බැලුවා, එම ඇතුන්ගේ අසත්පුරුෂ ක්‍රියාව දුටුවා. ඇත් රජුට කලකිරුණා. "මේ පිරිවරත් , සේනාවත් අතර මට සුදුසු අය නැහැ. මෙවුන් අතහැර මාගේ මව මම පෝෂණය කරන්නෙමි" කියා ඇත් රජ තීරණයට පැමිණියා. දිනක් රාත්‍රියේ කිසිම ඇතකුට නොපෙනෙන සේ මව රැගෙන චණ්ඩෝර නම් පර්වතය මුලට ගියා.

බෝසත් ඇතා හිමාලයේ නෙළුම් විලක් අසල තිබූ පර්වත ගුහාවක මව තබා පෝෂණය කළා. මේ අතරේ බරණැස් නුවර වාසය කළ එක්තරා වැද්දෙක් හිමාලයට පැමිණ මහා වනාන්තරයේ අතරමං වුණා. මංමුළා වී අනාථ වූ ඒ පුරුෂයා උදව් ඉල්ලා කෑ ගසමින් මේ විල ආසන්නයේ කැලයේ ඇවිදින්නට වුණා. බෝසත් ඇතාට ඒ ශබ්දය ඇසී

"මේ පුරුෂයා අනාථ වෙලා, අසරණ වෙලා, බියට පත්වෙලා සිටින්නේ. මම මෙතැන සිටිද්දී ඔහුට මරණයට පත්වීමට ඉඩ දිය නො හැකියි. එනිසා ඔහු සමීපයට ගොස් කතා කළ යුතුයි" සිතා ඔහු වෙත ගියා. ඇතා දුටු ඒ පුරෂ යා තවත් බියට පත්ව දුවන්නට සැරසුණා.

"එම්බා පුරුෂය, මම නුඹට කරදරයක් නොකරමි. බියක් ඇති කර ගත යුතු නැත. කුමක් හෙයින් තොප හඬමින් උදව් ඉල්ලන්නේ ද?"

"ඇත් රජුනි, මම මංමුළා වූවෙක්මි. අද මගේ සත්වැනි දිනය යි."

"බිය නොවන්න. මම ඔබව මිනිස් වාසයක් කරා ගෙන යන්නෙමි. නුඹ මගේ පිට මතට ගොඩවන්න" කියා ඔහු කැලයෙන් බැහැරට පිටත් කළා.

ඒ පව්ටු පුරුෂයා නගරයට ගොස් මේ ඇතා ගැන රජුට කියන්නට සිතා ගස් සහ පර්වත හඳුනා ගතහැකි ආකාරයට සලකුණු කරමින් කැලයෙන් නික්මී බරණැස නුවරට පැමිණියා.

මේ කාලයේ රජුගේ මංගල ඇතා මිය ගියා. එනිසා තමාට ගැලපෙන ආකාරයේ අතකු දුටු කෙනෙක් සිටිනවා ද? දන්වා අණබෙරයක් ගසනු ලැබුවා. වහාම ඒ වැදි පුරුෂයා රජු වෙත පැමිණ

"දේවයන් වහන්ස, මම ඔබවහන්සේට සුදුසු, ඉතා හීලෑ ඇත් රජකු දුටුවෙමි. මාර්ගය මම පවසන්නම්. පිරිස මා සමඟ එවනු මැන" යි ඔහු ඉල්ලා සිටියා. රජු ඔහු මාර්ග උපදේශකයා කොට වනයට ගොස් "මොහු විසින් කියන ලද ඇත්රජු ගෙන එවයි" අණ කරමින් ඒ වැද්දා සමඟ බොහෝ පිරිසත් හස්ති ආචාර්යවරයකු ද යවනු ලැබුවා. කැළයට ගිය පිරිසට දැක ගන්නට ලැබුණේ බෝසත් ඇතා නෙළුම් විලට බැස ආහාර ගන්නා අයුරු යි.

බෝසත් ඇතා අර හස්ති ආචාර්යවරයා ඇතුළු පිරිස දුටුවා. ඔහු සිතුවා "මට අද මේ අනතුර සිදුවන්නේ කිසිවකු නිසා නොව එදා මම ඒ වැදි පුරුෂයා ගේ ජීවිතය බේරා යැවූ නිස යි. මම මහත් බල ඇත්තෙමි. ලෙහෙසියෙන් ම ඇතුන් දහසක් නසන්නට පොහොසත් වෙමි. රටවල් සහිත බල සේනා නසන්නට මට ශක්තිය ඇත. නමුත් මම කිපුණොත් මා සමාදන් වූ සිල්පද බිඳී යන්නේ ය. එනිසා මා කපා මෙතැන මරණයට පත් කළත් මම නො කිපෙමි යි"! දැඩි අධිෂ්ඨානයක් ඇතිකර ගත්තා.

හස්ති ආචාර්යවරයා පියුම් විලට බැස ඇතාගේ ලක්ෂණ සම්පත් දැක

"එව පුත" කීය. බෝසත් ඇතා ඒ අණට කීකරුව ළංවුණා. රිදීදමක් මෙන් වූ සොඬින් ගෙන පිරිස බරණැස් නුවර බලා පිටත් වුණා. ගමනට දින හතක් ගත වුණා.

තම පුතු නො එන බව දැනගත් ඒ මව් ඇතින්නී

"අනේ මගේ පුතා රාජ මහාමාත්‍යයන් විසින් අල්ලා ගෙන යන්නට ඇති. පුතා ඇසුරු කළ මේ වනය දැන් හඬා වැටේවි" ආදී පුතාගේ ගුණ කියමින් මේ මව් ඇතින්න විලාප දෙන්නට වුණා.

ඇත් ගොව්වා නුවරට යන අතරේ රජුට පණිවිඩයක් යැව්වා. හසුන දුටු රජු වහා නගරය අලංකාර කළා. කෑම බීම රැස්කර තැබුවා. ඇත්ගොව්වා විසින් බෝසත් ඇතා කෙළින්ම ඇත් හලට ගෙන ආවා. සුවඳ මැටි ගා සුවඳවත් කළා. අලංකාර ලෙස සරසන ලද ඇත්හලට පමුණුවා විසිතුරු තිරයෙන් වටකොට රජුට දන්වා යැව්වා ඇතා ගෙන ආ බව.

රජු නොයෙක් අග්‍ර රස ඇති භෝජන රැගෙන ඇතා බලන්නට පැමිණියා. ඇත්රජු මව නැති නිසා ආහාර ගත්තේ නැහැ. රජු ඇතාගෙන් මෙසේ ඉල්ලා සිටියා.

"ඇතුනි, ආහාර ගන්න. ඔබ ආහාර නොගත්තොත් දුර්වල වේවි. ඉදිරියට ඔබට කරන්නට බොහෝ රාජකාරි තිබෙනවා". ඒ අසා බෝසත් ඇතා මෙසේ කියා සිටියා.

"මහරජ, මාගේ මව අන්ධ ය. ඒ අන්ධ මව මාගේ වෙන්වීමේ දුකෙන් අවට ඇති ගස්වැල් , දැව කොටන් පාදයෙන් තලා පොඩිකර ඒ පර්වත පාමුල කම්පාවෙන් ඇති. ඇය බොහෝ ශෝක කරනවා ඇති".

"ඇත් රජුනි, අන්ධ වූ පිළිසරණක් නැති ඇය ඒ පර්වතයෙහි දැව කොටන් පයින් තලා පොඩි කර දමන්නේ ඇයි?"

"මහරජතුමනි, මම මගේ අන්ධ වූ මව පෝෂණය කරමි. මා නැතිව ඇය ජීවිතක්ෂයට පත්වෙයි. ඇය නැතිව මට රාජ සම්පතෙන් වැඩක් නැහැ. අද මගේ මව ආහාර නොගෙන සිටින සත්වන දිනය යි".

"ඇත් රජුනි, එය නම් මහා ආශ්චර්යයකි. තිරිසන් යෝනියේ ඉපිදත් ඔබ මව පෝෂණය කරන බව ඇසූ විට මට අධික සතුටක් ඇතිවුණා. මිනිසුනේ, මේ ඇත් රජු අපට මහත් වූ ආදර්ශයක් සපයනවා. රාජපුරුෂයෙනි, මේ මහා ඇතු වහා නිදහස් කරව්. මොහු තම මව සහ නෑයන් සමඟ එක්වේවා"!

ඇතා බැම්මෙන් නිදහස් කළා. මඳක් විවේක ගත් ඇතා රජුට දසරාජධර්මයන් ගැන අනුශාසනාවක් සිදුකළා. ඇතා පිටත් වීමේ දී මහජනයා විසින් සුවඳ මල් ආදියෙන් මහ ඇත් රාජයා පිදුවා.

නගරයෙන් නික්මී එක් දිනයක් තුළ නෙළුම් විල අසලට පැමිණියා. සත් දිනක් ආහාර නැති නිසා දුර්වල වී සිටි මවගේ ශරීරයට ජලය ඉසින්නට ගත්තා. වැස්ස වසිනවා යැයි සිතා ඇත් මව

"මාහට උපස්ථාන කළ මගේ පුතා නැති කල කුමට ද වැස්ස මගේ ශරීරය තෙමනුයේ?"


"මෑණියනි, මම ආවෙමි. නැඟිටින්න. මේ ඔබගේ පුතා පැමිණ සිටින්නේ. නුවණ ඇති ඒ කසීරට රජු මා නිදහස් කළා".

ඒ ඇසූ ඇය බොහෝ සතුටට පත්වුණා. ඇය මෙසේ කීවා.

"හැමදාම වැඩිහිටියන්ට සලකන මගේ පුතා නිදහස් කළ කසීරට වැසියනුත්, ඒ රජතුමාත් බොහෝ කල් සුව සේ වසත්වා"! ඇත් මව ආශිර්වාද කළා.

කසීරජු මේ බෝසත් ඇතා ගැන බොහෝ පැහැදී නෙළුම් විල ආසන්නයේ ගමක් ඉදිකොට බෝසත් ඇතාටත්, ඒ මවටත් නිරතුරුව සැකසූ ආහාර ලබා දීමට කටයුතු කළා. කාලයාගේ ඇවෑමෙන් මව් ඇතින්නිය කළුරිය කළා. බෝසත් ඇතු ශරීරයට ගෞරව දක්වා මිහිදන් කොට කරණ්ඩක නම් ආශ්‍රමයට පැමිණියා. එහි තවුසෝ පන්සියයක් වාසය කළා. රජු විසින් බෝසත් ඇතා සිහිවීම පිණිස ඒ ප්‍රමාණයේ ම ගල් පිළිමයක් කරවා මහත් වූ සත්කාර කරවූවා. දඹදිව වාසීහු වසරක් පාසා රැස් වී ඇතා වෙනුවෙන් උත්සව සැමරුවා.

ඒ කසී රජු ආනන්ද තෙරණුවන් ය. පව්ටු පුරුෂයා නම් දෙව්දත් තෙරණුවන් ය, හස්ති ආචාර්යවරයා සැරියුත් තෙරණුවන් ය. ඇතින්නිය මහාමායා දේවියයි. ඒ ඇත් රජු අපගේ බෝසතාණන් වහන්සේ ය.



නයනා නිල්මිණී

# සම්බුද්ධ ශාසනයේ දියුණුව වෙනුවෙන් කැපවෙනවා



**උදාර පැවිදි දිවියක පිය සටහන් ඔස්සේ මෙවර සාකච්ඡා මණ්ඩපයට වැඩම කරනු ලබන්නේ**
**මහා විහාර වංශික ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ මහා ලේඛකාධිකාරී**

## අත්තන්ගනේ සාසනරතන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය.

**ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ මහා ලේඛකාධිකාරී ධූරය දරමින් ශාසනාභිවෘද්ධිය උදෙසා මහානීය සේවයක නියුතු ඔබ වහන්සේ කුඩා සන්ධියේ සසුන් බඹසර පුහුණු වූ අයුරු පැහැදිලි කරමින් සාකච්ඡාව ආරම්භ කරමු. අපේ හාමුදුරුවනේ,**

මගේ ජන්මෝත්පත්තිය සිදුවුණේ උදාර ශාසනික යුග මෙහෙවරක් ඉටුකළ මහ තෙරවරු වැඩසිටි ඓතිහාසික පසුබිමක් තිබෙන සත්කෝරලය ප්‍රදේශයේ දී. වර්ෂ 1955 ක් වූ ජනවාරි මස 27 වැනිදා චන්ද්‍රසේකර හේරත් හිටිහාමි කෝරාළලාගේ හිටිහාමි මහෝපාසකතුමා, බාලසූරිය මුදියන්සේලාගේ සීලවතී උපාසිකා මාතාව බොහොම ගුණගරුක සද්ගුණවත් ආදරණීය මව්පිය දෙපළක් බවත්, පුණ්‍යානුමෝදනාපූර්වකව සිහිපත් කළ යුතුයි. ඒවගේම 8 වන ශ්‍රේණිය දක්වා මූලික අධ්‍යාපනය ලබාගත් අත්තන්ගනේ රජයේ විද්‍යාලයත් මේ අවස්ථාවේදී ගෞරවයෙන් සිහිපත් කිරීම වැදගත්. සංසාරගත පුණ්‍ය මහිමයත්,පුරණ ලද පාරමී බලයත් හේතුවෙන් උතුම් පැවිදි ජීවිතයට ඇතිවුණ රුචිකත්වය නිසාම අත්තන්ගනේ සාසනරතන යන උත්තරීතර ශාසනික නාමයෙන් උතුම් සම්මාසම්බුද්ධ ශාසනයේ උත්තරීතර ප්‍රව්‍රජ්‍යාභූමියට පත්වුණා. වර්ෂ 1968 මාර්තු මස 13 වැනිදා කුලියාපිටිය දියකලමුල්ල රණතුංග මුදලින්දාරාම ( ශ්‍රීපති පිරිවෙන් විහාරය) මහා විහාරාධිපතිව වැඩ විසූ අතිගරු වෙරළුගම රතනජෝති නාහිමිපාණන් වහන්සේගේ ආචාර්යත්වයෙන් කුලියාපිටිය අස්සැද්දුම ශාසනාලංකාර මහා විහාරාධිපති අතිපූජ්‍ය මහෝපාධ්‍යාය කට්ටමුර්ච්චානේ සිරි සුභාරතී නාහිමිපාණන් වහන්සේගේ උපාධ්‍යායත්වයෙන් පැවිදි පුණ්‍යෝත්සවය සිදුවූ බව කෘතවේදීව ගෞරවපූර්වකව මේ අවස්ථාවේදී සිහිපත් කළ යුතුයි. නිවැරැදි ශාසනික ප්‍රතිපදාව අනුගමනය කළ සුපේශල ශික්ෂාකාමී අර්ථචර්යාවෙහි පිළිපන් ආචාර්යපාදෝත්තම නාහිමිපාණන් වහන්සේගේ අභාසය, අවවාද, අනුශාසනා මගේ පැවිදි ජීවිතයට ආදර්ශයක් වුණා.


ඒ වගේම දියකලමුල්ල ශ්‍රීපති පිරිවනේ වැඩ සිටි ලංකා ශාසනාම්බරය අලෝකවත් කළ සාර්වභෞම වියත් ඇදුරු මඬුල්ලක් හමුවේ ධර්ම ශාස්ත්‍රීය ශික්ෂණය ලබා ගැනීමට තරම් භාග්‍යවන්ත වුණා. ශාසනානුලෝමී හැඟීමෙන් කටයුතු කළ අද්දැකීම්වලින් පිරිපුන්,පරිණත, විචක්ෂණ බුද්ධියෙන් සමුපලක්ෂිත එම යතීන්ද්‍රයන් වහන්සේලාගේ ඇසුර පැවිදි ජීවිතය සර්ථක කර ගැනීමට මූලිකම හේතුව වුණ බව පුණ්‍යානුමෝදනාපූර්වකව කෘතවේදීව සිහිපත් කළ යුතුයි.

1973 වර්ෂයේ දී අනුරාධපුර බුද්ධශ්‍රාවක ධර්ම පීඨයට ඇතුළත්ව පස් අවුරුදු ත්‍රිපිටකවේදී උපාධි පාඨමාලාව සාර්ථකව හදාරමින් 1979 වර්ෂයේ දී ත්‍රිපිටක විශාරද උපාධිය ලබා 1980 වර්ෂයේ දී කැලණිය විශ්ව විද්‍යාලයට ඇතුළත් වුණා. 1983 වර්ෂයේ දී සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධිය සමත්ව 1992/1993 වර්ෂවල දී ශාස්ත්‍රපති උපාධිය ලබා ගැනීමට කටයුතු කළා.

එම ධර්මශාස්ත්‍රීය අධ්‍යාපනය ලබා ගත් කාල පරිච්ඡේදයේදී ම නිසි වයස සම්පූර්ණ වීමත් සමඟ 1974 වර්ෂයේ දී ජූලි මස 24 වැනි දින කළුතර කළු ගඟ උදකුක්ඛේප සීමාමාලකයේ දී අතිපූජ්‍ය දීපේගොඩ චන්දවිමලාභිධාන මහා නාහිමිපාණන් වහන්සේගේ මූලිකත්වයෙන් පැවැත්වූ උපසම්පදා පුණ්‍ය මහෝත්සවයේ දී උතුම් අධිසීල සංඛ්‍යාත උපසම්පදා සීලයට පත්වීමට භාග්‍යවන්ත වුණා.

**ධර්ම විනයධර,බහුශ්‍රැත භික්ෂූන් වහන්සේ නමක් වශයෙන් ශාසනික මෙන්ම සමාජ සේවාමය වශයෙන් සිදුකරන කාර්යභාරය කෙටියෙන් සඳහන් කරන්න නායක හාමුදුරුවනේ,**

විහාරස්ථ ශාසනික සේවය වශයෙන් දියකලමුල්ල ශ්‍රීපති පිරිවෙන් මහා විහාරාධිපති පදවියට පත්වීමෙන් අනතුරුව එම විහාරස්ථානය සියලු විහාරාරාංගයන්ගෙන් සමලංකෘත දර්ශනීය විහාරස්ථානයක් බවට පත්කළා. ශ්‍රීපති දහම් පාසල,ශ්‍රීපති ළදරු පාසල වගේම පිරිවෙන් පුස්තකාලය,ඊරියගොල්ල අනුස්මරණ මහජන පුස්තකාලය, ශ්‍රීපති සුභසාධක සංගමයේ බෞද්ධ පොත්හල ආරම්භකරමින් ජලනළ පද්ධතිය ස්ථාපනය කරමින් උපෝෂථාගාරය නවීකරණය කිරීමට කටයුතු කළා. ඉහළ කලුගමුව ග්‍රාමෝදය මණ්ඩල සභාපති පදවිය දරමින් ශ්‍රී රතනජෝති ප්‍රජා සංවර්ධන හා සමාජීය පදනම ආරම්භකරමින් ඒ හරහා ප්‍රදේශයේ ආර්ථික දුෂ්කරතා ඇති ළමුන් වෙනුවෙන් මාසික ශිෂ්‍යත්ව ක්‍රමයක් ක්‍රියාත්මක කළා . සුනාමි විපතට පත් දරුවන් වෙනුවෙන් ශ්‍රීපති බාලක පිරිමි ළමා නිවාසය ආරම්භ කළා වගේම ළමා රක්ෂණ හා පරිවාස දෙපාර්තමේන්තුවේ විශේෂ ඉල්ලීම මත ශ්‍රීපති බාලිකා පියස ගොඩනගමින් සමාජ සේවා රාශියක් මේවන විටත් සිදුකරගෙන යනවා.




1980 වර්ෂයේ දී ප්‍රාදේශීය සංඝ සභාවේ නියෝජ්‍ය ලේඛකාධිකාරී ධූරයට පත්වෙමින් නිකාය සංවර්ධන සමාජිකත්වය හ එහි විධායක සභාවට ඒක්වෙමින් 1988 වර්ෂයේ දී කුලියාපිටිය ප්‍රාදේශීය සංඝ සභාවේ ලේඛකාධිකාරී ලෙස කටයුතු කළා.

1995 වර්ෂයේ දී ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ පාලක සංඝ සභා සාමාජිකත්වයට හා අනුවිජ්ජක තනතුරට 1997 වර්ෂයේ දී එම නිකායේ පරියත්ති පාලක සභාවේ සාමාජික ධූරය දරමින් 1998 වර්ෂයේ දී එම නිකායේ ජෙට්ඨානුවිජ්ජක තනතුරට පත්වෙමින් ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකාය වෙනුවෙන් විශාල ශාසනික සේවාවක් සිදුකළා. එම ශාසනික සේවය පිළිබඳ ප්‍රසාදයට පත්වුණ ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ අතිපූජ්‍ය මහානායක මාහිමිපාණන් වහන්සේ විසින් 2003 වර්ෂයේ දී එම නිකායේ කාරක සංඝ සභිකයකු ලෙස පත්කිරීමට කටයුතු කළා. එම වසරේ දී ම පරියප්ති පාලක සභාවේ භාණ්ඩාගාරික ලෙස ක්‍රියා කරමින් 2007 වර්ෂය වන විට ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ නියෝජ්‍ය පරියප්ති ලේඛකාධිකාරී තනතුරට පත්වුණා. එම වර්ෂයේදීම නිකායේ සමන්නේසන සභාවට හා නිකායේ ආගමික ගැටලු කළමනාකරණ කමිටුවේ ලේකම් පදවියට පත්කළා.

2011 වර්ෂයේ දී නියෝජ්‍ය සඤ්ඤ ලේඛකාධිකාරී වශයෙනුත්, 2015 වර්ෂයේදී උපරිමානුවිජ්ජක වශයෙන් පත්වෙමින් ශාසනය වෙනුවෙන් විශාල කාර්යභාරයක් සිදු කළා.

සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය අභිවෘද්ධිය පිණිස කළ සේවයත්, ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ සුභසිද්ධිය සඳහා සිදුකළ සේවයත් ඇගයීමට පාත්‍රකරමින් ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ මහා ලේඛකාධිකාරී තනතුරට පත්කිරීමට කටයුතු කළා. 2015 වර්ෂයේ සිට බුද්ධ ශාසන අමාත්‍යංශයේ බෞද්ධ උපදේශක සභාවේ උපදේශක මණ්ඩල සාමාජිකත්වයත්,2016 වර්ෂයේ සිට ජනාධිපති ජාතික බුද්ධි මණ්ඩල සාමාජිකත්වයත්, රජරට විශ්ව විද්‍යාල පාලක මණ්ඩල සාමාජිකත්වයත්, අනුරාධපුර භික්ෂු විශ්ව විද්‍යාලයේ උත්තරීතර මණ්ඩල සමාජිකත්වයත්, 2017 වර්ෂයේ සිට අධ්‍යාපන අමාත්‍යංශයේ සමස්ත ලංකා පිරිවෙන් උපදේශක තනතුරටත් පත්වෙමින් සම්මා සම්බුද්ධ ශාසනයේ ඉදිරි දියුණුව වෙනුවෙන් කැපවීමෙන් කටයුතු කරනවා.

**නූතන සමාජ අර්බුදය විසඳීමෙහිලා ඔබවහන්සේ දරන අදහස සඳහන් කරමින් අපේ සාකච්ඡාව අවසන් කරමු නායක හාමුදුරුවනේ,**

දීර්ඝ කාලීන ජාතික ප්‍රතිපත්තියක් මත රට පාලනය නොවීමේ විපාක තමයි අපි මේ අත්විඳින්නේ.කාලයෙන් කාලයට ප්‍රතිපත්ති වෙනස් වුණ ක්‍රමයක් තිබෙන නිසා තමයි මේ තත්ත්වය උදාවෙලා තිබෙන්නේ. මේ රට සිංහල බෞද්ධ සමාජයක් තිබෙන රටක් වශයෙන් සිංහල බෞද්ධ සංස්කෘතියෙන් පෝෂණය වෙලා තිබෙන නිසා නායකත්වය භික්ෂුවට හිමිවෙනවා. ඒ අනුව අපේ මූලස්ථානවලින්, වෙහෙර විහාරස්ථානවලින් ලබාදිය යුතු නිවැරැදි නායකත්වය රාජ්‍ය නායකත්වයට සහ රටේ ජනතාවට ලබාදීම වැදගත්. මේ අර්බුදකාරී අවස්ථාවේ දී ආත්මාර්ථකාමී නොවී සමඟි සම්පන්නව සියලු දෙනාම රට වෙනුවෙන්, ජනතාව වෙනුවෙන් සුහදශීලීව, සාමූහික ව කටයුතු කිරීම ඉතාම වැදගත්.

හේමමාලා රන්දුනු

# අල්ප සැපය නම් වූ මුළාවෙන් මිදෙන්නට වීරිය වඩන්න

**තථාගතයන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මය ශ්‍රාවකයා වෙත දේශනා කිරීමේ දී තථාගතයන් වහන්සේ අනුගමනය කළ පිළිවෙත පිළිවෙළ කතා නම් වේ. එම පිළිවෙළ කථාවන්හි පළ මුවැන්න දන කතාව යි. ඇසළ පුර අටවක පෝදා (20) අපි ඒ ගැන කතා කළෙමු.**

පිළිවෙළ කථාවේ දෙවැන්න ශීල කථාව යි. ශීලය නම් ඉන්ද්‍රිය සංවරය යි. ඉන්ද්‍රිය සංවරය නම් කය වචනය හික්මවා ගැනීම යි. අල්ප සැපය නමැති මුළාවෙන් බේරා ගැනීමට වීර්යය කිරීමයි.

ශීල සමාදානය මනාව සිදු කළ හැකි දන් දෙන අයට ය. ජීවිතයේ රැකවරණය, ආරක්ෂාව පතා අපි ආරක්ෂිත තැන් සොයමු. ඒ ආරක්ෂාව ලැබෙන හොඳම තැන ශීලය යි. ශීලයෙහි පිහිටා සිටින්නේ එය ආරක්ෂා ස්ථානයකි.

ශීලයෙහි අරමුණ නම් රකින්නා හට පිහිට ලබා දීමයි. ශීලයෙහි පිහිටා සිටින්නේ, පහසු ස්ථානයක (බැඳීම් නැති) සිටින්නා වැනි ය. ශීලයෙහි පිහිටා සිටින්නේ, අව්, වැසි, සුළං ආදියෙන් ආරක්ෂා වන නිහඬ ලෙනක සිටින්නා වැනි ය. ශීලය ආරක්ෂා කිරීම මෙලොවට හා පරලොවට යහපතකි.

“මහණෙනි, ශීලය මාගේ වංශය”යි බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක. ශීලයෙහි සංවරව පිඬු සිඟා වැඩි බුදුරජාණන් වහන්සේ දුටු බිම්බිසාර රජතුමා හා සුද්දෝදන රජු කළ විමසීමකට පිළිතුරු දෙන්නේ, මහරජ, ඒ ඔබේ රාජ වංශය යි. මේ මගේ බුද්ධ වංශය යි” යනුවෙන් දේශනා කළ සේක. බුදුරජාණන් වහන්සේ ශීලයෙහි අනුසස් දේශනා කරන්නේ, “මහණෙනි, මා තිරිසන් ආත්මභව ලබා සිටියදී සංඛපාල නාගරාජව, භූරිදත්ත නා රජව, චම්පෙය්‍ය නම් නාගරාජ කාලයෙහි, ශීලව නාග රාජව සිටියදී, මාතුපෝෂක හස්තිරාජ කාලයෙහි ඡද්දන්ත හස්තිරාජ කාලයෙහි යන නොයෙක් ආත්ම භාවයන් හි ශීලය පිරුවෙමි. මෙලොව පරලොව සැප අතරෙන් ශීලය හා සමාන සැපතක් තවත් නැත. යනුවෙනි.

එදා රජව සිටි බොහෝ රජවරු, රාජ කුමාරවරු හා සිටුවරු පැවිදිව ශීලයෙහි පිහිටීමෙන් පසු රජ යහනට, සිටු යහනට වඩා සැපෙන් ගල්තලාවේ, ආරණ්‍යයේ, ලෙන් තුළ හා වනයේ සැතපෙන බව උදාන වාක්‍ය දේශනා කර ඇත.

ශීලාලංකාරය සමාන අලංකාරයක් වෙනත් නැත. නොපැහැදුණ අය පැහැදෙන ලෙසත්, පැහැදුණු අය වඩාත් පහදින ලෙසත් හැසිරීමට බුද්ධානුශාසනාව වූයේ භික්ෂූන් වහන්සේට සිල්වත්කම අලංකාරයක් සේ සලකමිනි.

ශීලය මලක් නම්, ඒ මල හා සමාන වෙනත් මලක් නැත. සිල් සුවඳ සමාන සුවඳක් නැත. තුවරලා සමන් හා සඳුන් සුවඳ යටි සුළඟට පමණි. සිල් සුවඳ උඩු සුළඟට ද හමයි. දස දිග පතුරුවයි. සිල් නමැති සුවඳ ආලේප වූයේ ලෝ වැස්සෝ ද, දෙවියෝ ද, තෘප්තියෙන් බලන්නේ මුත් සෑහීමකට පත් නොවෙති.

මේ, ශීලය දිව්‍ය ලෝක සම්පත් ලබා දෙන්නේ ය. පිළිවෙළ කථාහි තෙවැන්න සග්ග කථා ය. සග්ග කථා යනු දිව්‍ය ලෝක සම්පත් කථා ය.ශීලය නිසාම දෙව්ලොව සැප ලබන්නේ ය. මේ දෙව්ලොව සම්පත් ඉෂ්ටය. එනම් ප්‍රිය මනාප, රුචි ඇති තැනකි.

මේ ස්වර්ගයෙහි නිතර ඇත්තේ ක්‍රීඩාවෝ ය. වරක් බුදුරජාණන් වහන්සේගෙන් ධර්මය අසා ගිය සක්දෙවිඳු කෙළින්ම ගියේ උයන් ක්‍රීඩාවට ය. පසුපස ගිය මුගලන් හිමි සක් දෙවිඳුට ධර්මය සිහි කළේ සත්මහල් වෛජයන්ති ප්‍රාසාදය මහපටැඟිල්ලෙන් සෙළවීමෙන් පසුව ය.

ස්වර්ග සම්පත්ති කෙතෙක් දැයි දේශනාවෙන් නිමකළ නොහැකි ය.

මෙසේ බුදුරජාණන් වහන්සේ අලංකාර කොට දිව්‍ය ලෝක සම්පත් වදාළ නමුත් ස්වර්ණාභරණයෙන් සැරසූ ඇතාගේ සොඬ කපා හෙළන්නා සේ මේ ස්වර්ගය ද අනිත්‍ය ය, අස්ථිරය ආදී වශයෙන් දේශනා කොට මේ ස්ථානය පිළිබඳ බලවත් රාගය නොකට යුතු යැයි දැක්වීම පිණිස මේ සියලු කම් සැප අල්ප වූ ආශ්වාද ඇත්තේ ය. බොහෝ දුක් ඇත්තේ ය. බොහෝ උපායාස (දැඩි ශෝකය) ඇත්තේ ය. මෙහි බොහෝ ආදීනව ඇත්තේ යැයි මේ ආදී ක්‍රමයෙන් කාමයන්ගේ ආදීනව ද, පහත් බව ද, කිළිටි සහිත බව ද දේශනා කළ සේක.

ස්වර්ග සම්පත් බුද්ධ ශ්‍රාවකයකු ලබනුයේ නම් සෝවාන්, සකෘදාගාමී, ඵලයක් සහිතව ලැබීම බුද්ධ දේශනාවට අනුගත ය. එවන් උපතක් සම්බෝධි පරායන එනම් නියතව නිවනට සුදුසුකම් ලැබීම වූ හෙයින් ම ය.

මීළඟට එන්නේ ආදීනව කථා ය. ආදීනව නම් දෝෂය යි. පහත් බව යි. ළාමක බව යි. කාමයෝ සත්ත්වයා කිළිටි කරයි. කාමයෙහි හැසිරීම නිසා ලැබෙන අල්ප ආශ්වාදයනට තැති ගන්වන ආදීනව ලැබෙන අයුරු දේශනා කළ සේක.

මනුෂ්‍ය ලෝකයෙත්, දිව්‍ය ලෝකයන්හි හා සතර අපායන්හිත් කම් සැප ඇති බව බුදුදහම පිළිගනී. අපිදූ ස්වල්ප ආස්වාද ඇති කම් සැප සැපක් සේ සිතන්නාක් මෙන්, සතර අපායන්හි නිරි සත්ත්වයෝ ද තමාට හුරු වූ දුක් රැසක් සැප සේ ගෙන සතර අපායෙන් පවා මිදීමට අකැමැත්තෝ ය.



එනිසා සතර අපාය ද කාම ලෝකයන්හිලා ගැනේ.

මේ ආශ්වාදය බොළඳ හා ළාමක වූවක් බවත්, අස්ථිර හා අල්ප බවත් දේශනා කරනු ලබන්නේ මෙසේ ය.

මනුලොව පංච ඉන්ද්‍රියයන් පිනවීම හා දෙව්ලොව දෙව් සැප යනු කම් සැප විඳීම ය. කාමයෝ ඇට සැකිල්ලකට බඳු උපමා වේ. (මස්, ලේ නැති ඇට පමණි) කාමයෝ මස් වැදැල්ලක් බඳු ය. ලත් ලත් තැන ලගී කාමයෝ තණ හුලක් බඳු ය. එනම් උඩු සුළඟට අල්ලාගෙන යන වියළි තණ යොදා සෑදූ දැවෙන පන්දමක් බඳු ය.

කාමයෝ ගිනි අඟුරු වළකට බඳු උපමා ඇත. දැවෙන ගිනි අඟුරු වලක් දෑතින් හා දෙපයින් දෙදෙනකු ඔසවා අල්ලා සිටින්නාක් මෙනි.

කාමයෝ සිහිනයක් බඳු ය. සිහිනෙන් දුටු සම්පත් කිසිවක් අවධි වූ විට නැත.

කාමයෝ පිරුවටයක් බඳු ය. ණයට, කුලියට ඉල්ලා ගත් පිරුවටය ආපසු දිය යුතු ය. කාමයෝ රුක් පල බඳු ය. ඉදුණු පලය කොයි වේලේ වැටේ දැයි කිව නොහැක.

මෙසේ දාන කථා, ශීල කථා හා සග්ග කථා දේශනා කළ තථාගතයන් වහන්සේ මෙසේ ද දේශනා කළ සේක. යම් සේ අල්පමාත්‍ර අසුචි දුගඳ වේ ද මහණෙනි, මම භව ප්‍රතිසන්ධිය ඇඟිලිපොලන කල් (ඇඟිල්ලෙන් ඇඟිල්ල ගසන කාලයක්) පමණකුදු වර්ණනා නොකරමි. මුත්‍රා, කෙළ, සැරව, ලේ මදකදු දුගඳ වේ ද එසේ මම භවය වර්ණනා නොකරමි. එහෙයින් නෙක්ඛම්ම හා සාමුක්කංසික දේශනාවන් ම බුදුදහම වෙති. අනෙකුත් කථා සියල්ල ධර්මයට නැඹුරු කිරීමේ පරමාර්ථ කොටගත් සම්මුති දේශනා වේ.

පස්වැන්න නෙක්ඛම්ම කථා යි. එනම් කාමයෙන් වෙන්වීමේ කථාව යි. ඉහත දැක් වූ කාමයන්ගේ අල්ප ආස්වාදයෝ නිසා සත්ත්වයෝ සසර පුරා ඉපදෙමින්, මියයමින් දීර්ඝ ගමනක නිරතව සිටින හෙයින් කාමයන්ගෙන් වෙන්ව සිටීමේ ආනිශංස දේශනාව නෙක්ඛම්ම කථා නම් වේ.

මේ ලෝකයෙහි කිසිදු කාම වස්තුවක් නැත. කිසියම් වස්තුවක් කාම බවට පත්වනුයේ, වස්තුකාම බවට පත්කරගනුයේ තම තමාගේ සිතින් ම ය. මේ බව යමෙක් දනී ද, දකී ද, ඔහු කාම වස්තූන්ගෙන් වෙන්ව යාම මේ නික්මීම යි. අනාගාමී මාර්ගයේ දී කාම රාගයෙන් මුළුමනින් මිදේ.

සයවැන්න සාමුක්කංසික (උත්කෘෂ්ට) ධම්ම දේශනාව යි. එනම් තමා ම මතු කොටගත් ධර්මය දෙසීම යි. ‘සාමුක්කංසික’ යනු තමා ම මතු කොට ගත යුතු, තමා ම ඇති කර ගත යුතු, ස්වයම්භූ ඥානයෙන් දක්නා ලද, දැකිය යුතු, අනුන්ට අසාධාරණ වූ ධම්මතාවය සඳහා ශාස්තෘන් වහන්සේ අනුගාමිකයාට කරන අනුශාසනාව යි. අවවාදය යි.

මේ කුමක් ද? ආර්ය සත්‍ය දේශනාව යි. ඒ, දුක්ඛ, සමුදය, නිරෝධ හා මග්ග නම් වූ චතුරාර්ය සත්‍යය දේශනාව යි. පටිච්චසමුප්පාද හේතු ප්‍රත්‍යය) දේශනාව යි.

නිවන යනු කුමක්ද? සියල්ල අත් හැරියේ නිවන යි. මෙහි පුද්ගල, සත්ත්ව හෝ සංස්කාර නැත. හේතු ප්‍රත්‍යයෙන් හටගන්නා සියල්ල සංස්කාරයි. සංස්කාරයන්ගේ නිත්‍ය ස්වභාවය වෙනස්වීමයි. හටගැන්මත්, විනාශයත් හේතු ප්‍රත්‍ය වන හෙයින් හට ගැන්මත් විනාශයත් අතර ඇත්තේ වෙනස්වීමයි. මෙසේ හටගැන්මක්, වෙනස්වීමක්, හා විනාශයක් යන සංඛත ධර්මතා නැත්තේ නිවනෙහි ය. නිවන අසංඛතය. නිවනෙහි හේතු ප්‍රත්‍ය හටගැන්මක් නැත. හට ගැන්මක් නැති තැන පැවත්මක් හෝ වෙනස්වීමක් නැත.

හටගැන්මක් නැත්තේ විනාශයක් හෝ මරණයක් නැත. මේ නිවන යි. අල්ලා ගැනීම දුකට හේතු වේ. අත්හැරීම සැපයට හේතුවේ. සුඛය නම් අත්හැරීම යි. චේතනා මුල්කොටගත් කර්ම (ක්‍රියා) නූපදවා ගන්නේ ඊළඟ භව උප්පත්තිය සඳහා විඤ්ඤාණයක් නොමැත. විඤ්ඤාණය නැත්තේ පුනර්භවයක් නැත. නිවීගිය පහන් දැල්ල සේ භවකිස නිම කරන අයුරු කියා දෙන දේශනාව මේ සාමුක්කංසික දේශනාව යි.

ත්‍රිපිටක පරිවර්තන මණ්ඩලයේ ලේකම්
( බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව
බුද්ධශාසන අමාත්‍යාංශය)
**කේ.කේ. සුගතපාල**





# කෑගලු පුරවරයේ පින්බර පින්බිම ගනේගොඩ පුරාණ රාජ මහා විහාරය

**දුටු නෙත් ඇසිල්ලෙන් ආනන්දයට පත් කරන පින්බර පින්බිමක් කෑගලු පුරවරයේ දී අපට මුණගැසෙයි. බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ අලවතුර ගම්මානය සමීපයට වන්නට මෙකී විහාරය දැක ගත හැකි ය. මෙය නමින් ගනේගොඩ පුරාණ රාජ මහා විහාරය නම් වෙයි.**

ගනේගොඩ ගම්මානයෙන් ගොස් දෙගොඩතලා යන දිය පහර මැදින් ටික දුරක් ගිය විට මෙම රාජකීය විහාරය කළු ගල් මස්තකයේ සාඩම්බර ලෙස වැඩ සිටින අපූරුව දැකගත හැකි ය. අතීතයේ රාජකීය නරපතීන්ගෙන් පවා අභිෂේක ලද මෙකී පුද බිම අද නිස්කාරණයේ නිහඬ වී ඇති සැටි ශෝකජනක ය. එකී නිහඬතාවයේ බැරෑරුම් බව පැවසීමට මත්තෙන් එම විහාරය සතු වටිනාකම් පැහැදිලි කිරීම සුදුසු යැයි සිතමි.

මෙම විහාරයේ ආරම්භක කතා පුවත තරමක් මතභේදාත්මක ය. ඒ සඳහා වන ජනප්‍රවාද එකිනෙකට වෙනස් ය. බොහෝ දෙනාගේ මතය වන්නේ මෙය වළගම්බා රජු දවස ඉදි කළ බවයි. මහාවංශයට අනුව වළ ගම්බා රජුගේ රාජ්‍ය කාලය වන්නේ ක්‍රි. පූ 103 - ක්‍රි .පූ 77 දක්වා කාල සීමාවයි.

මෙම විහාරය දෙස බැලූ බැල්මට එය එසේ යැයි හැඟීම වරදක් නැත.නමුත් යමක් නිත්‍ය වශයෙන් පැවසීමට නම් එය සාධනය කිරීමට අත්‍යවශ්‍ය සාධක පූරණය විය යුතු ය. එහෙත් සාධක නොමැතිව වුව ද මෙම ජනප්‍රවාදය පිළිගැනීමට කිසිවෙක් මැළි නොවෙති. එය කෙසේ වුවත් මෙකී විහාරස්ථානය පිළිබඳ ලිඛිතමය සාක්ෂි ඉදිරිපත් වේ.

සද්ධර්මරත්නාකරය තුළ මෙම විහාරය පිළිබඳ සටහනක් එයි. එහි එන පරිදි මෙම විහාරය ගොඩනංවා තිබෙන්නේ සීලවංස ධර්මකීර්ති හිමියන් විසිනි. එහි කියැවෙන ආකාරයට සීලවදස තෙරුන් වහන්සේ ඉන්දියාවේ ධාන්‍යකටක යන විහාරයක් හා ලංකාවේ අලවතුර ප්‍රදේශයේ ඉදිකර වූ විහාරයක් පිළිබඳ එහි කියැවේ. “තවද දේශාන්තරයෙහි ජරාවාසව තිබූ ශ්‍රී ධාන්‍යකටක නම් ගල් විහාරයක් කර්මාන්තයෙන් පෙර පරිද්දෙන්ම ප්‍රකෘතිමත් කරවමින්....ද ස්වදේශය වූ සිංහලද්වීපයට වැඩ බොහෝ පින් රැස් කරමින් අලවතුරේ පර්වතාග්‍රයෙහි වාල් මෙහෙවරින් විසිතුරු විහාරයක් ද....” ආදී වශයෙන් පූර්ණ හෙළිදරව්වක් මෙහි වෙයි.

කෙසේ වෙතත් මෙයින් අපට සිතිය හැක්කේ මෙම විහාරය සීලවංස තෙරුන් ඉදිකළ බවකි. සමහර විටෙක මේ මතයන් දෙකම වුව ද සත්‍ය විය හැකි ය. මෙය සීලවංස තෙරුන් විසින් ඉදිකළ පසු වළ ගම්බා රජු විසින් සතුරන්ගෙන් සැඟවී සිටීමට භාවිත කළා විය හැකි ය.

මෙහි විහාර වස්තු හා කලාවන් පිළිබඳ සලකා බැලීම අතිශයින් වැදගත් ය. විහාරස්ථානය පිහිටා තිබෙන්නේ සුන්දර පරිසරයක ය. එය ජනගහණය අධික නොවූ කලාපයකි. ආරම්භය ලබන්නේ ආකර්ෂණීය ගල් පඩිපෙළකිනි. එහි ගල් පඩි 250 කි. විහාරය මුළුමනින් ම පාහේ නිර්මාණය වන්නේ දැවැන්ත කළු ගලකිනි. එහි පවතින්නේ ආරූඪ කරගත් පුහු ආඩම්බරයක් නොව සැබෑ ලෙස ස්ථාපිත වූ අභිමානයකි.

එච්.සී.පී බෙල් මහතා කෑගලුකෝරළ වාර්තාවට මෙම විහාරය පිළිබඳ විස්තර සපයයි. එච්.සී.පී බෙල් මහතා දෙදිනක් පුරා ගම් වාසීන් සමඟ එක්ව නටබුන් සොයා බලා ඒවා එකතු කොට විහාර බිමට ගෙන ගොස් දමා තිබේ. එතුමන් එහි සඳහන් කරන බොහෝ කොටස් අද එහි දක්නට නැත.

එතුමන් එකතු කරන ලද නටබුන් අතර කුළුණු හිස් කුළුණුවල බඳ කොටස් ආදී අංග තිබී ඇත. එමෙන්ම මෙම විහාරය කළු ගල් වේදිකාවක් මත තනි එලයකින් නිර්මාණය කර ඇත. සමස්ත විහාරය ම පාහේ දැවැන්ත වහළයකින් වැසී තිබේ. මෙලෙස මෙහි ගෘහ නිර්මාණ ශිල්පය ඉහළ තත්වයක පවතින බව කිව හැකි ය.

ඊට අමතරව මෙහි කලාංගයන් පිළිබඳ අවධානය යොමු කරන්නේ නම්, මෙහි ඇති කැටයම් සුළුවෙන් තැකිය නොහැකි ය. මෙහි විසිතුරු මල් කැටයම්, මොණර රූප, බුද්ධ රූප ආදිය දක්නට ලැබේ. මෙහි ද්වාර මණ්ඩප දෙකක් දැකගත හැකි ය.

එහි බාහිර ද්වාර මණ්ඩපය අඩි 18 × 21ක් වේ. එමෙන්ම ඇතුළත ද්වාර මණ්ඩපය අඩි 14 × 20 ක් තරම් වේ. මෙහි ඇති කළුණු තුනක පාදම සකස් වී ඇත්තේ සිංහයකු විසින් එය උසුලා සිටින ආකාරයටය. එය යන්තමින් හෝ වෙනස් වන්නේ නම් සිංහයාගේ වලිගයේ නැමීමෙන් පමණි. එසේම මෙම ගල් බිත්තිය චිත්‍රාවලියකින් සපිරී තිබීම වැදගත් ය. මෙම චිත්‍ර සඳහා බෙහෙවින් උපයෝගී කරගෙන ඇත්තේ රතු පැහැයයි. ශ්‍රී ලංකාවේ බොහෝ විද්වතුන් දක්වන්නේ එම චිත්‍ර තුළ නුවර කලා ආභාසය එහි ඇති බවයි.

ලාංකීය සංස්කෘතික අනන්‍යතාවක් සහිත මෙම සුවිශේෂී කලාගාරය ශ්‍රී ලාංකීය අනන්‍යතාව ලෝකය අභිමුව ප්‍රකාශට පත් කරන එක් පුරුකකි. රාජකීය ඉතිහාසයක් සහිත මෙම ජාතික ආගමික සංස්කෘතික නිධානය රැක ගැනීම අප සතු වගකීමකි.

කඩතොලු වූ භෞතිකත්වය පිළිසකර කෙරෙමින් අනාගත උරුමයක් සුරැකීමේ මෙහෙවරට අපිත් දායක විය යුතු ය. මෙවන් ආගමික වටිනාකම් සහිත සංස්කෘතික නිකේතනයක් වෙනුවෙන් සැබෑ බෞද්ධයන්ගේ දෑස් විවර වේවා’යි පතමු.

---

කැලණිය විශ්ව විද්‍යාලයේ
පාලි බෞද්ධ අධ්‍යනාංශයේ
විශේෂවේදී සිව් වන වසර
**කේ. ඒ ශෂී සඳලංකා ධර්මරත්න**







## ඇසළ අසිරිය

පතමින් බුදු පදවි හැර දා ලද   නිවන
දිවකුරු සමිඳු තබමින් විවරණ   සවන
ඉපදී බෝසතුන් තුසිතයෙ දෙව්   විමන
මව් කුස පිළිසිඳුනි අත්කරගෙන   සෙවණ

සැප විඳ දිවියෙ කුමරුන් කළ කිරුණ   සැනින්
පුතු රාහුල ඉපිද ඇති බව අසා   කනින්
අභිනික්මනය කර මහ රෑ ඇසළ   දිනින්
බෝසත් බවුන් වැඩුවා තවුසකුව   නිතින්

බුදු බව ලබා ඉසිපතනෙ දි දහම්   දෙසයි
බුදු රැස් අසිරි විඳ නර දෙව් දහම්   අසයි
මඟ එල නිවන ඇතිකර හදවතට   තොසයි
ආලෝකයෙන් දිලුනේ දම් එළිය   නිසයි

**කැස්බෑවේ මුණසිංහ නිශ්ශංක**

## දළදා හිමි තවම මගෙ හද මඬල තුළයි



අවටින් ඇදෙන සිසිලස රන්   ස්වරයක් ය
එහි ඉපදීම මා ලද මහ   වරයක් ය
ලොව තුළ වෙන නොමැති ඉමිහිරි   හරයක් ය
ඒ තම්බපණ්ණිය මට සුර   පුරයක් ය

වැසුණත් දදය සසරෙ ම ඒ   සිහිනවලයි
මනසට මැවේ මුතු පාවඩ පෙරට   එළයි
මතකය දැනෙද්දී දෙනෙතට කඳුළු   ගලයි
දළදා හිමි තවම මගෙ හද මඬල   තුළයි

හිත සතුටින් කියමි අද මම එදා   ගැන
කරඬුව වඩමවන මොහොතක උදා   උන
කැළලක් නොදුන්නෙමි යුතුකම බෙදා   ගෙන
මතක ද ගියා පාවාඩෙත් හදා   ගෙන

දරුවකු සේ හිතා තත්පරයක්   ගානේ
කලු මාමා පියකු උනි අමතක   නෑනේ
හද පතුලෙන් කියන්නෙමි මම මගෙ   හීනේ
සසරෙම මට ඔබේ පුතු වෙන්නයි   ඕනේ

සිහි වෙයි නිතර හැම පෙරහර   නිසැකව ම
නොහැකි ය එදා සේ එතැනට   ළඟා වු ම
මා කළ පිනෙන් මට හිමි තැන   ගෙනාව ම
ඉපදෙමි යළිත් දළදා   මාලිගාවෙ ම

විඳගම් සතුට දුක සමඟින්   කතා වෙමි
මා සිහි කළ ඔබට සෙනෙහස   ඔතා දෙමි
ඉඩ ලද සැනෙන් හමුවෙන්නට   හිතා ගමි
සමුගමි මම නැදුන්ගමුවේ   ඇතා වෙමි

**දික්වැල්ල දීඝවාළුකාරාම රාජමහා විහාරාධිපති, සමස්ත ලංකා සාම විනිසුරු**
**සීනිපැල්ලේ රතනවංස නා හිමි**



## හිමි සඳ වැඩි සඳ

හිමිගෙ සරණ පිහිට ඇති මුත්
එමඟ නොයනා මිනිසුනේ
නොගිය ඒ නුඹලාටමයි මේ
සසර ගමනේ වැරදුණෝ
අනේ සම්බුදු හිමියනේ
සත්‍යමයි හිමි දෙසු දහම්.....

ධර්මයේ මඟ යනෙන අයහට
කිසි දිනක නෑ වැරදුණෝ
හිමි දෙසූ සදහම් මඟ ම ගොස්
සදාකල්හි ම සැනසුනේ
අනේ සම්බුදු හිමියනේ
සත්‍යමයි හිමි දෙසූ දහම්.....

**බණ්ඩාර අදිකාරි**
**ගාල්ල**

# පහන් සිතක කවි



**සංස්කරණය**
**දීපා පෙරේරා**

## දානය

බෙරහඬ වාදනය යොදුනක් දුර   ඇසෙන
හෙණ හඬ යොදුන් දොළොසක් දුර   පැතිර යන
දෙන හඬ යමක් කෙනකුට දානය   ලෙසින
මහ හඬ නැඟෙනවලු තුන්ලොව   එකලු වන

කරදිය ලබා දෙන වැසි දිය ලොව   රැගෙන
සරු දෙය ලොව තනා යළි මුහුදට   එවන
දෙන දෙය මෙසේ කෙනෙකුන්හට කර   දෙගුන
ලැබෙතිය තමන් වෙත ඒ ගැන සැක   නොවන

අරිමින් පිට වාන සැලකිලි මත   බැලෙන
ජලයෙන් සපිරි වැව් සුරැකී තව   දිලෙන
විලසින් යමක් ඇති නුවණැත්තන්   යෙදෙන
දීමෙන් මෙලොව පරලොව යහපත   සැදෙන

හැම විට තමන් සතු සම්පත්   සඟවගෙන
තම පරිභෝජනය වෙනුවෙන් වත්   නොගෙන
කැමැතිව වෙනත් අයෙකුන් හට හෝ   නොදෙන
එම අය “තණ පඹයො” මෙනි කුඹුරේ   සිටින

**විශ්‍රාමලත් පරිවේණාචාර්ය ජී.බී. ගුණරත්න**
**සිරි මිහිඳු දහම් පාසල, කෝරළඉම**

## අභිනිෂ්ක්‍රමණය

දැක දැන මෙලොව දන දුක විඳවන   කරුණු
නෙක පැන අතර සිදුහත් තනිවුණි   තුරුණු
දැක පුතු නිදන යුරු මව් තුරුලට   වැදුනු
දුක මැඩ නිම කළා කල ගිහිගෙය   රැඳුනු

රියසක විලස බාලේ සිට ළඟ   උන්න
කරුණක් පවසමින් සුමිතුරු හට   ඡන්න
කන්ථක අසුපිටින් නේරංජන   පැන්න
අමතක කළා සැම අරමුණ වෙත   යන්න

උනමින් පැළඳි සළුපිළි අභරණ   සිදුහත්
තබමින් එ සැම තම හිතවත අත   නැණවත්
කරමින් සිරස මුඩු ගෙන අසිපත   මුවහත්
ඇඳුමින් සැරසුණා බඹු සක්දෙව්   පුදලත්

අතහැර උරුම සැප සම්පත්   සැම දේ ම
තනිකර තමන් යනු දුටු හිමි   නොකියා ම
දියකර හදෙහි දුක හෙළු නෙතු   අග බෝ ම
සුරපුර ගියා කන්ථක එම   මොහොතේ ම

සම්බුදු පදවි ලැබ පිස දැන දුක   කඳුළ
තිලොවග සතට පෑ සෙනෙහස මෙත්   සිසිල
අභිනික්මන් කළේ පෝ දිනයක   ඇසළ
බොදු සිත මැකී නැත නේරංජන   ගඟුල

**වට්ටාරම**
**ටී.ඇම්. පොඩිරාලහාමි**



## සැනසීම

නිමක් නොදැක ඇවිදින බව සසරේ
නැවතුමක් පමණ ම ය මා ලද මිනිස් බව
මෙලොවේ.....
හිස් ලූලූ අත දිව යන සිත
චණ්ඩ මාරුතය සේ
බැඳ දමයි මා
යනෙන බෝ දුර
රුදුරු මේ සසරේ....
වසාලූ සිත අඳුරු සළුපට
මුදා හැර බෝ සේ
බැඳ දමා සිත කුසල් දමකින්
දුක පිරුණ සසරේ
ගමන නිම කර
සදා සැනසෙමු
අමා දම් සෙවණේ

**ගයානි වරකාගොඩ**
**රත්නපුර**

## බුදුසරණ පහන් සිතක කවි

BCC

සම්පූර්ණ නම :– ....................................................................

ලිපිනය :– ....................................................................

දුරකථන අංකය :– ....................................................................

අව අටවක, අමාවක, පුර අටවක, පසළොස්වක
සතර පෝදටම ඔබේ නිර්මාණ 'පහන් සිතක කවි' පිටුවේ පළවේ.
ඔබගේ කාව්‍ය නිර්මාණ කූපනය සමඟ පහත ලිපිනයට යොමු කරන්න.
සංස්කාරිකා,පහන් සිතක කවි, බුදුසරණ කර්තෘ මණ්ඩලය, ලේක්හවුස් - කොළඹ.

# දුටුගැමුණු රජු ජය ගතහොත් බුදු සසුන සුරක්ෂිතයි

දුටුගැමුණු මහ රජතුමා

73 කොටස

රාජ සභාව අවසන් විය. මාළිගයෙන් එළියට පැමිණි සිරිනාගට සිහි වූයේ පෙරදා ශ්‍රී මහා බෝධීන් වහන්සේ අසලදී රජ කුමරිය කළ ඉල්ලීමයි. ඒ සමගම ඔහු අසලට පුණ්ණා පැමිණියා ය.

"සිරිනාග අසු පිටින් රාජකීය උද්‍යානයට යන්න. එහි නෙළුම් කුළුණ ළඟ කෘෂ්ණා කුමරිය ඉන්නවා. ,මාත් දන්තිත් තව සුළු මොහොතකින් එතැනට එන්නම්."

රාජංගනයේ දොරටුව අසල ගැට ගසා සිටි අසු පිටට නැඟී සිරිනාග දුටුවේ දන්තිත්, පුණ්ණාත් දීඝාභය සහ උපතිස්ස සමග කතාබහක යෙදෙන අයුරු ය. ඒ ගැන සැලකිල්ලක් නොදැක් වූ ඔහු රාජකීය උද්‍යානය දෙසට අසු මෙහෙය විය.

උයන් දොරටුවේ අසු රඳවා, මුරකරුට පවරා ඔවුන් පෙන්වූ දෙසට පිය නැඟුවේ ය.

කැළඹුණු සිතින් නෙළුම් පොකුණ වෙත යන ඔහු දැක, පොකුණෙහි පඩි පෙළ මත හිඳ ගෙන සිටි කුමරිය නැගිට ගත්තා ය. ඒ සමගම පුණ්ණා ද, දන්තිද උද්‍යානයේ අනෙක් පැත්තේ සිට පැමිණියහ.

"පිය රජතුමා රජ මාලිගයට යන්නට ප්‍රථම රජ මාලිගයට ගියොත් හොඳයි. "

"ඔව්, පුණ්ණා රාජ සභාවේ අලුත් තීරණ ටික සිරිනාගගෙන් අහගෙන ඉක්මණට යමු ."

"අමුතු කිසිවක් නැහැ. යුද්ධයට සුදානම් වෙන්නට අණ කළා. තුණ්ඩිලට පනවා තිබුණු තහනම ඉවත් කළා. මහවැලි තොටමුණුවල කඳවුරු දීඝාභය මහසෙනෙවිතුමාට පැවරුවා. අභ්‍යන්තර ආරක්ෂාව තුණ්ඩිලට. විජිතපුර බලකොටුව උපතිස්සට. සමස්ත උතුරු ප්‍රදේශයේ ම නිරීක්ෂණය සිරිනාග මහා සෙනෙවිට කියමින් ඔහු සිනාසුණේ ය.

"බොරු, දීඝාභය මහා සෙනෙවිතුමා ඒකට කැමති නැහැ. ඒක පැවරෙන්නේ සිරිනාග මහා සෙනෙවිතුමාට" දන්ති කීවා ය.

"අද රාජ සභාව ගත් තීරණය මම කිවේ. ඒවා වෙනස් වෙන්නට පුළුවන් යුද්ධ මණ්ඩලයේ දී . "

"උපතිස්ස සෙනෙවි පන්නා ගැනීමට දීඝජන්තු මහා සෙනෙවිට තිබෙන වුවමනාව කුමක්ද ?" පුණ්ණා ඇසුවා ය.

"ඔහු ඉහළ නිලයකට පත් කර රහස් දූත මෙහෙවරක යොදවන්නටයි හදන්නේ. "

"එතකොට විජිතපුර බලකොටුව ?"

"දීඝජන්තු මහා සෙනෙවි යෝජනා කාළේ තුණ්ඩිල පත් කරන්න. නමුත් මහ රජතුමා කැමති නැහැ "

විජිතපුර මේ රාජධානියේ ආරක්ෂණ මුණාත අපි සියලු දෙනාටත් වැටහේවි. මෙයින් බේරෙන මගක් කවුරුත් හිතන්නේ නැහැ. යුද ගිනි දැල්වෙනවා ද ? නිවා දමනවා ද ? කුමක්ද හොඳ ?"

"කුමරියනි, එයට පිළිතුරු දෙන්නට කැමති නැහැ. උද්ගතවන අවස්ථාව අනුවයි එය තීරණය කරන්නේ. "

"සිරිනාග, මම මේ යුද්ධයට කැමති නැහැ. මේ රාජධානිය අයිති දුටුගැමුණු රජතුමාට. ඒ ඔහුගේ පාරම්පරික උරුමය. අපි මේ රට ආක්‍රමණය කළ විදේශික සතුරු පිරිසක්. අපේ පිරිස අතින් මේ රටට, ජාතියට, ආගමට සිදු වී ඇති හානිය විශාලයි. ඒ බව දැන දැනත් දුටුගැමුණු රජතුමාගේ හිතවතකු වෙන්නට පියරජතුමා කැමති නම් මේ යුද්ධය අහෝසි වෙයිද ?"

සිරිනාග පුදුමයෙන් බලා සිටියේ ය. කුමරියගේ තර්කය මෙන්ම නිගමනයද සාධාරණය. එහෙත් ක්‍රියාවට නැඟිය නොහැකි ය.

"කුමරියනි, අප රජතුමා එබඳු බාල්දු වීමකට කොහෙත්ම කැමති නැහැ. "

:"ඒකම තමයි මහා අවාසනාව සිරිනාග. මම මගේ පියාණන්ට ආදරෙයි. මගේ පියාත් ඔහු. මවත් ඔහු. ඉතින් මට ඔහුගේ විනාශය ඉවසන්නට පුලුවන් ද ?"

"අපේ එකම අරමුණ රජතුමා බේරා ගැනීමයි කුමරිය "

"එහෙත් ඒ නිසා ගැමුණු කුමාරයාට කිසිදු හානියක් විය යුතු නැහැ. අද සිරිනාගට මෙහි එන්නට කිවේ එය අවධාරණය කරන්නයි . අපි යනවා "

"සිරිනාග පුදුමයට පත් විය. මේ කෘෂ්ණා කුමරිය කුමක් කියන්නේ ද? ඇයගේ මේ අදහස් රජතුමා දන්නවා ද ? කුමරිය මෙහෙයවන්නේ කවුරුන්ද ? පුණ්ණා දන්ති දෙදෙනාත් මේ අදහස අනුව යමින් සිය පෙම්වතුන් තම අරමුණට නම්මා ගනීද ?"

සිරිනාග මහත් විමතියෙන් කල්පනා කළේ ය.

ස්වකීය මන්දිරයෙන් ආ සිරිනාග , මෙතෙක් තමන් එනතුරු දිවා භෝජනය නොගෙන සිටි සමන්ති මෑණියන් සමග භෝජනාගාරයට ගොස් ආහාර ගැනීමට හිඳ ගත්තේ ය.

"මෑණියනි රජ කුමරියගේ පැවැත්ම ඉතා අමුතුයි. ඇය මාගම තොරතුරු අපට වඩා හොඳින් දන්නවා. ගැමුණු රජතුමාගේ සේනාංක ගමන් ගන්නා මාර්ග, ලැගුම් ගන්නා ස්ථාන දැනට සිටින ස්ථානය සියල්ල නිවැරැදි ලෙස කියනවා. ඇයට මේවා දන්වන්නේ කවුරුන්ද ?"

"ඔව් පුතා, පුණ්ණාත් පුදුම වෙනවා. එළාර රජතුමා , තුන්ඩිල සොළී රටින් ගෙන්වා ගෙන සිටින්නේ දු කුමරියගේ ආරක්ෂාවට. යුද්ධය ජයගත් පසු ඔහුට කුමරිය විවාහ කොට දී සොළී රටට යැවීමලු රජතුමාගේ අදහස. ඒත් කෘෂ්ණා කුමරිය දුටුගැමුණු රජතුමා හැර වෙන කිසිම කෙනකු සමඟ සරණ බන්ධනයකට කැමති නැහැලු."

සිරිනාගගේ සිතෙහි බලපෑ වික්ෂිප්ත භාවය ලිහිල් වුව ද මේ තරුණියන් තිදෙනාට අපේක්ෂිත විමුක්තියට ළඟා විය හැකි දැයි වේදනාවෙන් යුතුව කල්පනා කළේ ය.

"සිරිනාග, පුතා අමතක කරන්නට එපා කෘෂ්ණා කුමරිය, පුතාගේ අක්කණ්ඩි. විමලිගේ අක්කා සුමලිගේ දියණිය. පුතාගේ වැඩිමහල් සහෝදරිය ."

"මෑණියනි, මෙතෙක් මගේ කල්පනාවෙහි නොරැඳුණු කරුණක්. ඒත් ඇගේ ජන්මය ඇගේ ඉලක්කයට බාධා කරාවි. කෙසේ නමුත් මෑණියන් මේ ඥතිත්වය මගේ මතකයට නැංවූ එක නම් හොඳයි."

දිවා භෝජනයෙන් පසු විවේකාගාරයට ඇතුළු වූ සිරිනාගගේ සිතට විවේකයක් නොවිය. පුටුවක හිඳගත් ඔහු දෑස් පියාගෙන කල්පනාවට වැටුණේය.

"මාගමට යැවූ පරෙවියා තවම අවේ නැහැ. මහාසිව මාහිමියනුත් යුද පෙරමුණේ ගමන් කරනවා ද ? මහවැලි ගං තීරයේ තොටමුණුවල ආරක්ෂක බලකොටු බළ සේනාවෙන් හරි අඩක් එතෙර දීම විනාශ කරන්නට පුළුවනි. ගැමුණු රජතුමා මගේ යෝජනාව අනුමත කළා. "

"කසාතොට බළකොටුව අවසන් වරට බිඳ දමා , මහවැලි ගඟින් මෙතෙර වූ පසු , ගැමුණු රජතුමා එන්නේ විජිත පුරයට. ඒ එන විට එම බළකොටුව තුළ අවුලක් ඇති කළ හැකි නම්........."

"උපතිස්ස එතැනින් ඉවත් කොට තුන්ඩිල පත් කළහොත් සිංහල සෙබළුන් තුළ කලකිරීමක්, භේදයක් මතු කරන්නට පුළුවන්. "

"දීඝාභය මහා සෙනෙවි දැන් දැන් මා දෙස බලන්නේ සැකයෙන්. මාගමින් මා ලබා ගන්නා රහස් තොරතුරු ඔහුට පුදුමයක්. මහා රජතුමා මා කෙරෙහි තබා ඇති විශ්වාසය ඔහුට ඊර්ෂ්‍යාවක්. දීඝාභය ගං ඉවුරට තල්ලු කළහොත් විජිත පුරය පහසුවෙන් ජය ගන්නට පුළුවන්. එයින් මගේ සේවයෙහි අඩක් සාර්ථක වෙනවා."

සිංහලයාට ලජ්ජාව වසා ගන්නට , තමන්ට අයත් දිවයිනේ නිදහසේ සැරිසරන්නට. ස්වාධින හැඟීමෙන් හිස ඔසවන්නට නම් මේ ආක්‍රමණික පිරිස පන්නා දමන්නට ඕනෑ. මේ සත්‍යය මට වටහා දුන් මහාසිව මහා ස්වාමින් වහන්සේට මම ණය ගැතියි. ඒ ණය ගෙවන්නට නම් ගැමුණු රජතුමාට ජය ලබා දෙන්නට උදව් දී එමඟින් බුද්ධ ශාසනය සුරක්ෂිත කරන්නට ඕනෑ. "

"අපේ භික්ෂුන් වහන්සේලා එළාර රජුගේ ව්‍යාජ ධර්මිෂ්ටකම තේරුම් ගෙන, ජාතියේ විනාශය, සිංහල සංස්කෘතියේ පරිහානිය ජනතාවට අවබෝධ කිරීමෙහි යෙදුනා නම් මේ අරගලය අනුරාධපුර රාජධානියේ අභ්‍යන්තර අරගලයක් බවට පත් කරන්නට තිබුණා."

අයන්ති විතාන

